# පාලි හා බෞද්ධ අධ්‍යයන
# පශ්චාත් උපාධි ආයතනය

**(කැලණිය විශ්වවිද්‍යාලය)**

## වාර්ෂික වාර්තාව - 2016



01. **දැක්ම**

**දැක්ම**

**පාලි හා බෞද්ධ අධ්‍යයනය සඳහා ලෝකයේ විශිෂ්ටතම පශ්චාත් උපාධි පර්යේෂණ මධ්‍යස්ථානය බවට පත්වීම**

## 02. මෙහෙවර

**මෙහෙවර**

**පාලි හා බෞද්ධ අධ්‍යයන ක්ෂෙත්‍රයෙහි දැනුම, ආකල්ප හා පර්යේෂණ කුශලතා වර්ධනය කිරීම සඳහා විද්‍යාර්ථීන්ට උපරිම අවස්ථා හා පහසුකම් සැපයීමේ විශිෂ්ටත්වයට ළඟාවීම**

# පටුන


| | |
|---|---|
| දැක්ම හා මෙහෙවර | |
| අධ්‍යක්ෂ ස්වාමීන් වහන්සේගේ සමාලෝචනය | 01 - 05 |
| කළමනාකාර මණ්ඩලය | 06 |
| පීඨසභාව | 07 |
| ආයතනයෙහි පරිපාලන හා අධ්‍යයන ව්‍යුහය | 08 |
| කාර්ය මණ්ඩල විස්තර | 09 - 10 |
| විගණන කමිටුව | 11 |
| පාඨමාලා විස්තර | 12 |
| ශිෂ්‍ය තොරතුරු | 13 - 17 |
| ත්‍යාග ප්‍රදාන | 17 |
| අධ්‍යයන කාර්ය මණ්ඩලය | 18 |
| පර්යේෂණ, සම්පාදනය සහ ප්‍රකාශන | 19 - 20 |
| පුස්තකාලය සහ පර්යේෂණ ඒකකය | 20 - 22 |
| ආයතනයෙහි මූල්‍ය කටයුතු | 23 - 25 |
| පසුගිය වර්ෂ 05ක ආයතනයේ මූල්‍ය තත්ත්වය | 26 |
| අවසාන ගිණුම් 2016 | 27 |

# 03. අධ්‍යක්ෂ ස්වාමීන් වහන්සේගේ සමාලෝචනය



## (අ) පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය පිළිබඳ කෙටි හැඳින්වීම

පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ආයතනයක් ලෙස 1975 නොවැම්බර් මස 23 වැනි දින ආරම්භ කරන ලදී. පාර්ලිමේන්තුව මගින් සම්මත 1980 ජනවාරි මස 01 වැනි දින සිට පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතන නියමාවලිය යටතේ මෙය ක්‍රියාත්මකය. මෙම ආයතනය දැනට බෞද්ධ දර්ශන අධ්‍යයනාංශය, බෞද්ධ සංස්කෘති අධ්‍යයනාංශය හා බෞද්ධ මූලාශ්‍රය අධ්‍යයනාංශ යන අධ්‍යයනාංශ තුනකින් සමන්විත වේ. පාලි හා බෞද්ධ අධ්‍යයන විෂය ධාරා යටතේ පශ්චාත් උපාධි ඩිප්ලෝමා, ශාස්ත්‍රපති, දර්ශනපති හා දර්ශන විශාරද යන පශ්චාත් උපාධි ලබාදීම සඳහා මෙම ආයතනය මගින් අධ්‍යයන කටයුතු සිදු කරනු ලැබේ.

ආරම්භයේ සිට මේ දක්වා පාලි හා බෞද්ධ අධ්‍යයන ක්ෂෙත්‍රයේ විද්වතුන් 07 දෙනෙකු මෙහි අධ්‍යක්ෂධූරය දරා ඇත. දැනට ථෙරවාද සම්ප්‍රදායේ පාලි හා බෞද්ධ අධ්‍යයනය පිළිබඳ ලෝකයේ ඉහළම ආයතනය බවට මෙම ආයතනය දෙස් විදෙස්හි ප්‍රචලිතව පවතී.

මෙම ආයතනයේ අධ්‍යක්ෂ ධූරයට 2013.10.15 වැනි දින සිට මම පත් වුනෙමි. එවකට පැපිලියාන, සුනේත්‍රාදේවී පිරිවෙන් පරිශ්‍රයේ කුලී පදනම මත ආයතනය පවත්වා ගෙන ගියේය. ඉන් අනතුරුව ආයතනයේ ව්‍යුහය පිළිබඳ සලකා බැලූ මම එවකට පැවැති ගැටළු විසඳා ගැනීම සඳහා ගරු උසස් අධ්‍යාපන අමාත්‍යතුමා හමු වුනෙමි. අනතුරුව එතුමාගේ ප්‍රධානත්වයෙන් 2013.11.06 වැනි දින උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේදී විශේෂ සාකච්ඡාවක් පවත්වන ලදී. දේශීය හා විදේශීය සිසුන් විශාල සංඛ්‍යාවක් අධ්‍යයන කටයුතුවල නියැලෙන මෙම ආයතනයේ තිබූ භෞතික සම්පත් ප්‍රමාණවත් නොවූ බව එදින අනාවරණය වූ බැවින් මෙම ආයතනය කුලී පදනම මත කොහුවල, දුටුගැමුණු වීදියේ අංක 113හි පිහිටි ගොඩනැගිල්ලට 2014.01.25 වැනිදින රැගෙන එන ලදී.

ඒ අනුව නව ගොඩනැගිල්ලට ප්‍රවේශ වීමත් සමඟ පෙර පැවතියාට වඩා උසස් මට්ටමේ අධ්‍යක්ෂ කාර්යාලය, දේශන ශාලා, අංශ ප්‍රධානවරුන් සඳහා කාර්යාල, පර්යේෂණ ඒකකය, පුස්තකාලය, පරිගණක විද්‍යාගාරය, පාලන, ශිෂ්‍ය කටයුතු හා මුදල් යන අංශවලට වඩා පුළුල් හා නවීන පහසුකම් වලින් යුතුව ඉඩ පහසුකම් ලබා ගැනීමට හැකි විය.

2016 වර්ෂයේ පටන් මෙම ආයතනය හැකිතාක් දියුණු කිරීම මාගේ අභිප්‍රාය විය. ඒ සඳහා මෙතෙක් මා විසින් ආයතනය වෙනුවෙන් කරන ලද සේවය කෙටියෙන් සඳහන් කරමි.

01. ආයතනය පිළිබඳ මූලික හැඳින්වීමක් සහිත පොත් පිංචක් නොතිබූ බැවින් එවැනි පොත් පිංචක් සකස් කිරීම.

02. පර්යේෂණ උපාධිලාභීන් සඳහා උපාධි ලබා දීමේදී එහි ගුණාත්මක භාවය රැක ගැනීම සඳහා නව නිර්ණායක මාලාවක් සකස් කිරීම.

03. මෙම ආයතනයේ දේශන පැවැත්වීම්, සම්මන්ත්‍රණ පැවැත්වීම් වැනි කටයුතු සඳහා සහභාගි වූ විද්වතුන්ගේ සංඛ්‍යාව ඒ වන විට ඉතා සුළු ප්‍රමාණයක් විය. ඒ පිළිබඳව සලකා බැලීමෙන් අනතුරුව දැනට ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවල සහ පාලි හා බෞද්ධ අධ්‍යයන විෂය පිළිබඳ සියලු ආයතනයන්හි විද්වතුන්ගේ සේවය මෙම ආයතනයට ලබා ගැනීමට ක්‍රියා කිරීම.

04. සම්පූර්ණ කර නොමැති දර්ශනපති හා දර්ශන විශාරද උපාධි අපේක්ෂකයන් ගේ අධ්‍යයන කටයුතු සම්බන්ධයෙන් සොයා බලා ඔවුන් ආයතනයට කැඳවා උපදෙස් ලබා දී එම අධ්‍යයන කටයුතු අවසන් කිරීමට දිරි ගැන්වීම.

05. විෂය ක්ෂෙත්‍රයේ විශේෂඥ දැනුම ඇති බාහිර ආරාධිත දේශකවරුන් මගින් දේශන පවත්වා ශිෂ්‍යයන්ගේ දැනුම වර්ධනය කිරීමට ක්‍රියා කිරීම.

06. පර්යේෂණ ක්‍රමවේදය පිළිබඳ සම්මන්ත්‍රණ ක්‍රමවත්ව පැවැත්වීමට කටයුතු යෙදීම.

07. ආයතනයේ භෞතික සම්පත් දියුණු කිරීම. කාර්යාලයීය උපකරණ ලබා ගැනීම හා ආයතනය වායු සමීකරණය කිරීම.

08. 2015 වර්ෂය තෙක් ආයතනයේ ස්ථිර කථිකාචාර්යවරුන් සිව්දෙනෙක් පමණක් සේවයේ යෙදී සිටියහ. 2016 වර්ෂය ආරම්භයේ සිට ඊට අමතරව තවත් ස්ථිර ආචාර්යවරුන් දෙදෙනෙකු බඳවා ගැනීමට කටයුතු කිරීම. එමෙන්ම අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පිරවීමට කටයුතු කිරීම.

09. සතියකට වරක් අධ්‍යක්ෂ හා මාණ්ඩලික නිලධාරින් සමඟ සාකච්ඡා කොට ආයතනයේ ප්‍රගතිය ඉහළ නැංවීමට අවශ්‍ය උපදෙස් ලබාදීම.

10. මසකට වරක් ආයතනයේ අංශ ප්‍රධානීන් සමඟ ප්‍රගති සමාලෝචන රැස්වීමක් පැවැත්වීම.

11. වර්ෂය ආරම්භයේදී සියලු ආයතනිකයන් හමුවීමට අවස්ථාවක් ලබා ගැනීම, සිංහල හා හින්දු අළුත් අවුරුද්ද සියලුම කාර්ය මණ්ඩලය සමඟ චාරිත්‍රානුකූලව සැමරීම, කාර්ය මණ්ඩල රැස්වීම් පවත්වා ඔවුන්ගේ ගැටලු සාකච්ඡා කිරීමට අවස්ථාවක් යෙදීම.

12. ආයතනයේ කීර්තියට හේතු වන පරිදි ආයතනය නියෝජනය කරමින් දේශීය මෙන්ම විදේශයන්හි සම්මන්ත්‍රණ පැවැත්වීම හා ප්‍රධාන කථිකයකු ලෙස සහභාගි වීම. එමඟින් ආයතනය ජාත්‍යන්තරයේ කීර්තියට භාජනය කිරීම. තවද සෙසු ආචාර්යවරුන් විසින් ලෝකයේ පැවැත්වෙන දේශන, වැඩමුළු, සම්මන්ත්‍රණ සඳහා සහභාගි කරවීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරන ලදී.

13. සිංගප්පූරුවේ Buddhist Library Graduate School ආයතනය සමඟ පවත්වා ගෙන යනු ලැබූ උපාධි පාඨමාලා ක්‍රමවත්ව පැවැත්වීමට කටයුතු යෙදීම. එම ආයතනයේ 2016 වර්ෂයේ ශිෂ්‍ය සංඛ්‍යාව 18 දෙනෙකු අධ්‍යාපනය ලැබූ අතර සමස්ත ආදායම රු.1,637,604.42ක් විය.

14. හොංකොංහි The Buddha-Dhamma Center ආයතනය සමඟ ගිවිසුමක් අත්සන් කොට අනුබද්ධ ආයතනයක් බවට පත් කිරීම. එම ආයතනයේ 2016 වර්ෂයේ ශිෂ්‍ය සංඛ්‍යාව 43කි. ඒ මගින් උපයාගත් සමස්ත ආදායම රු.9,003,220.52කි.

15. චීනයේ Buddhist Academy of Mt. Putuoආයතනය සමඟ අවබෝධතා ගිවිසුමකට 2016.10.17 දින අත්සන් තබන ලදී. ඒ අනුව අධ්‍යයන කටයුතු 2017 ජනවාරි මස ආරම්භ කිරීමට නියමිතය.

16. ඉන්දුනිසියාවේ Smaratunga Buddhist College ආයතනය සමඟ අවබෝධාත්මක ගිවිසුමක් අත්සන් කිරීමට අවශ්‍ය කටයුතු කිරීම. (නුදුරු අනාගතයේදී සිදු කිරීමට නියමිතය.)

17. මෙම ආයතනය සඳහා ප්‍රධාන ගැටළුවක්ව පැවති ස්ථිර ඉඩමක් ලබා ගැනීමට කටයුතු කිරීම. ඒ අනුව කැලණිය විශ්වවිද්‍යාලයේ මුතුරාජවෙල ඉඩමෙන් අක්කර 02ක් මෙම ආයතනයට ලබා දීමට උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ සහ කැලණිය විශ්වවිද්‍යාලයේ පාලක සභා අනුමැතිය ලබා ගැනීම. 2017 වර්ෂයේදී අක්කර දෙකක ඉඩම ආයතනය වෙත පැවරීමට නියමිතය.

18. පිළිවෙලින් වසරින් වසර ආයතනයේ ආදායම වැඩි කිරීමට කටයුතු කිරීම හා විශේෂයෙන් විදේශ විනිමය වැඩියෙන් ලබා ගැනීමට කටයුතු කිරීම. 2016 වර්ෂය තුළ දේශීය හා විදේශීය ශිෂ්‍ය සංඛ්‍යාවේ වර්ධනයක් පෙන්නුම් කර ඇත.

19. චීනය, හොංකොං, සිංගප්පූරුව, මියන්මාර්වැනි රටවලින් බෞද්ධ විෂය ක්ෂේත්‍රයට අදාළව හුවමාරු අධ්‍යයන වැඩසටහන් පැවැත්වීම, නව පාඨමාලා ආරම්භ කිරීම. මෙම ආයතනයේ අවශ්‍යතා මත යෝජනා ඉදිරිපත් කරන්නේ නම් ඒවාට ප්‍රතිපාදන ලබාදීමට ද සාකච්ඡාවල අවධාරණය විය.ශ්‍රී ලංකාවේ චීන තානාපතිවරයා හමුවී අධ්‍යයන හා සංස්කෘතික කටයුතුවල හුවමාරු වැටසටහන්වල කටයුතු සාකච්ඡා කරන ලදී.

20. 2016.11.18 වැනි දින අන්වේෂණ ශාස්ත්‍රීය කලාප දෙකක් ඉංග්‍රීසි හා සිංහල මාධ්‍යයෙන් ප්‍රකාශයට පත් කරන ලදී.

21. ආයතනයේ කාලීන තොරතුරු ඇතුළත් හසුන් පතක් (News letter) 2016 ජුනි මස මුද්‍රණය කිරීම.

22. 2016.10.19 දින විදේශීය සිසුන් 122 දෙනෙකුගේ සහභාගිත්වයෙන් සාර්ථක අධ්‍යයන චාරිකාවක් පොළොන්නරුව හා සෝමාවති පුදබිම ආශ්‍රිතව සිදු කිරීම.

23. ශ්‍රී ලංකාවේ විද්වතුන්ගේ සහභාගිත්වයෙන් 2016.11.29 වැනි දින ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී භික්ෂු කතිකාවතක් සිදු කිරීම.

## (ආ) ජයග්‍රහණ

පසුගිය වසර පහක කාලය තුළ දී පාඨමාලා සංඛ්‍යාව හා ජාතික ජාත්‍යන්තර ශිෂ්‍ය සංඛ්‍යාව වර්ධනය කිරීමෙන් බෞද්ධ අධ්‍යයන ක්ෂෙත්‍රයට අදාළ කටයුතු උසස් තත්වයකට පත් කිරීමට මෙම ආයතනය සමත් වී ඇත. 2015 විශ්වවිද්‍යාලය ප්‍රතිපාදන කොමිෂන් සභාවට අයත් ආයතන අතුරින් වැඩිම විදේශීය ශිෂ්‍ය සංඛ්‍යාවක් ඇති ආයතනය බවට පත් කිරීම. එම ආයතනයෙන් නිකුත් වන 2015 වාර්ෂික වාර්තාවේ ඒ බව සඳහන් වේ.

**සමත්වූ ශිෂ්‍ය සංඛ්‍යාව**

| | දේශීය | විදේශීය |
|---|---|---|
| 1. 2012 | 164 | 133 |
| 2. 2013 | 186 | 134 |
| 3. 2014 | 285 | 128 |
| 4. 2015 | 146 | 165 |
| 5. 2016 | 154 | 261 |

## (ඇ) පසුබෑසීම් හා සාධාරණීකරණය

මෙම ආයතනයට වසර තිස් පහකට අධික ඉතිහාසයකට හිමිකම් ඇතත් මේ දක්වා ඊට ස්ථිර භූමිභාගයක් හෝ ගොඩනැගිල්ලක් ලබා ගැනීමට හැකි වී නොමැත. නවීන ඉඩපහසුකම්වලින් සේවා සැපයීමට හැකි වන්නේ නම් ශිෂ්‍ය ආකර්ෂණය තවදුරටත් ඉහළ නැංවිය හැකිය. ආයතනයේ අනාගත සංවර්ධනය කෙරෙහි මෙම ගැටලු ඉතා අයහපත් ලෙස බලපාන බව සඳහන් කළ යුතුය. ශ්‍රී ලංකාවේ වැඩිම විදේශීය ශිෂ්‍ය සංඛ්‍යාවක් ඉගෙනුම ලබන මෙම ආයතනයෙහි නේවාසික පහසුකම් නොමැතිවීම හේතුවෙන් විදේශීය ශිෂ්‍යයන් සැලකිය යුතු ප්‍රමාණයක් අහිමි වීමද සැලකිය යුත්තකි.

## (ඈ) <u>අනාගත සැලසුම්</u>

1. ආයතනයට ලබා ගන්නා ඉඩම සඳහා ගොඩනැගිලි පහසුකම් ලබා ගැනීමට ව්‍යාපෘති යෝජනා සකස් කරමින් පවතී.
2. ආයතනය ජාත්‍යන්තර තලය දක්වා ගෙන යාමට දෙස් විදෙස් ආයතන සමඟ සම්බන්ධවීම.
3. නව පාඨමාලා හඳුන්වා දීම.

## (ඉ) <u>වෘත්තීය අවස්ථා</u>

කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, රුහුණු විශ්වවිද්‍යාලය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය සහ කොළඹ විශ්වවිද්‍යාලය යන විශ්වවිද්‍යාල සහ අනුරාධපුර ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය හා ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය පාලි හා බෞද්ධ අධ්‍යයන විෂය ධාරාවට අදාළ පාඨමාලා පවත්වන ආයතන වේ. ඒ අනුව පාලි හා බෞද්ධ අධ්‍යයන ක්ෂෙත්‍රයේ වෘත්තීය අවස්ථා රාශියක් ශ්‍රී ලංකාවේ පවතී. මෙම ආයතනයේ පශ්චාත් උපාධි ඩිප්ලෝමා, ශාස්ත්‍රපති, දර්ශනපති හා දර්ශන විශාරද පාඨමාලා සම්පූර්ණ කරන ලද විද්‍යාර්ථීන්ගේ සහය එම ආයතනවලට ලබා දීමට කටයුතු කරනු ලැබේ.

මෙම ආයතනයෙහි පාඨමාලා අවසන් කළ දේශීය හා විදේශීය විද්වතුන් රාශියක් උසස් අධ්‍යාපන ආයතනවල සේවය කරනු ලැබේ.

හොංකොංහි Buddha-Dhamma Center ආයතනයේ වර්තමාන අධ්‍යක්ෂ පූජ්‍ය මහාචාර්ය කේ.එල්. ධම්මජෝති හිමියන් හා ලෝක විශ්වවිද්‍යාල සංගමයේ ලේඛකාධිකාරී හා ඔක්ස්පර්ඩ් විශ්වවිද්‍යාලයේ ඉගැන්වීමේ කටයුතුවල යෙදෙන ආචාර්ය කම්මායි ධම්මසාමි හිමියන් ද මෙම ආයතනයේ ආචාර්ය උපාධිය ලැබූ විද්වතුන් වේ. චීනය, ජපානය හා එක්සත් රාජධානිය වැනි රටවල බොහෝ උසස් අධ්‍යාපන ආයතනවල මෙම ආයතනයේ පාඨමාලා සම්පූර්ණ කිරීමෙන් අනතුරුව සේවය කරන විශාල පිරිසක් සිටින බව සඳහන් කළ හැකිය. මේ අයුරින් සලකා බලන විට මෙම අධ්‍යයන ආයතනයේ පාඨමාලා සම්පූර්ණ කරන සියලු දෙනාටම රැකියා අවස්ථා රාශියක් දේශීයව හා විදේශීය පවතින බව සඳහන් කළ හැකිය.

තවද ශිෂ්‍ය ශිෂ්‍යාවන් බොහෝ දෙනෙකු තම රැකියා වල උසස්වීම් සඳහා මෙහිදී පශ්චාත් උපාධි හදාරනු ලැබේ. එබැවින් රැකියා පිළිබඳ ගැටලුවක් මෙම උපාධිධාරීන් සම්බන්ධයෙන් උද්ගත නොවේ.

# 04. කළමනාකාර මණ්ඩලය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වන වගන්තිය සමඟ කියවිය යුතු 140 වන වගන්තිය යටතේ සාදනු ලැබූ 1979 අංක 08 දරන පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතන නියමාවලියේ 10 වන වගන්තිය යටතේ කළමනාකාර මණ්ඩලය මෙම ආයතනයේ විධායක මණ්ඩලය වේ. එහි සාමාජික මණ්ඩලය මෙසේය.

**නිල බලයෙන්**

1. පූජ්‍ය මහාචාර්ය කොටපිටියේ රාහුල හිමි - අධ්‍යක්ෂ (සභාපති)
2. පී.ජී. ජයසිංහ මහතා - උසස් අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නාමිකයා
3. තරණි අනෝජා ගමගේ මහත්මිය - සංස්කෘතික කටයුතු විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නාමිකයා

**ආයතනයේ අධ්‍යයනාංශ ප්‍රධානීන්**

1. මහාචාර්ය පූජ්‍ය රළුවේ පද්මසිරි හිමි- අධ්‍යයනාංශ ප්‍රධාන, බෞද්ධ දර්ශන අධ්‍යයනාංශය
2. මහාචාර්ය පූජ්‍ය මිරිස්වත්තේ විමලඥාණ හිමි -අධ්‍යයනාංශ ප්‍රධාන, බෞද්ධ සංස්කෘතිය අධ්‍යයනාංශය
3. මහාචාර්ය ඩබ්ලිව්.එම්. දේශප්‍රිය ගුණසේන මහතා - අධ්‍යයනාංශ ප්‍රධාන, බෞද්ධ මූලාශ්‍රය අධ්‍යයනාංශය

**කැලණිය විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් පත් කරනු ලැබූ සාමාජිකයන්**

1. ඩී.බී. විජේකෝන් මහතා
2. වෛද්‍ය නන්ද අමරසේකර මහතා

**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබූ සාමාජිකයන්**

1. මහාචාර්ය විමල් ජී. බලගල්ලේ මහතා
2. මහාචාර්ය කුසුමා කරුණාරත්න මහත්මිය
3. මහාචාර්ය දයා එදිරිසිංහ මහතා
4. සී. මාලියද්ද මහතා

**භාණ්ඩාගාර නියෝජිත**

ආර්.එම්.එස්.පී.එස්. බණ්ඩාර මහතා - අධ්‍යක්ෂ - රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව

**කාර්යාලයීය උපස්ථිතියෙන්**

1. එල්.ඒ.සුමිත් ජයසේකර මහතා- ( ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී)
2. ඒ.පී.එස්.එම්. දොළගේ මහත්මිය - (ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී)

# 05. පීඨසභාව

1979 අංක 08 දරන පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතන නියමාවලියේ 13 වන වගන්තිය අනුව ආයතනයට පීඨසභාවක් තිබිය යුතු අතර එය ආයතනයේ අධ්‍යයන බල මණ්ඩලය වන්නේය. එහි සාමාජික මණ්ඩලය මෙසේය.

<u>නිල බලයෙන්</u>

1. පූජ්‍ය මහාචාර්ය කොටපිටියේ රාහුල හිමි - අධ්‍යක්ෂ (සභාපති)
2. මහාචාර්ය පූජ්‍ය රළුවේ පද්මසිරි හිමි - බෞද්ධදර්ශන අධ්‍යයනාංශය - අධ්‍යයනාංශ ප්‍රධාන
3. මහාචාර්ය පූජ්‍ය මිරිස්වත්තේ විමලඥාණ හිමි - බෞද්ධ සංස්කෘතිය අධ්‍යයනාංශය - අධ්‍යයනාංශ ප්‍රධාන
4. මහාචාර්ය ඩබ්ලිව්.එම්. දේශප්‍රිය ගුණසේන මහතා -බෞද්ධ මූලාශ්‍රය අධ්‍යයනාංශය - අධ්‍යයනාංශ ප්‍රධාන

**කැලණිය විශ්වවිද්‍යාලයේ පහත සඳහන් අධ්‍යයනාංශ ප්‍රධානීන්**

1.පූජ්‍ය මහාචාර්ය කහපොල සුගතරතන නාහිමි (නියෝජිත - කැලණිය විශ්වවිද්‍යාලයේ සංස්කෘත අධ්‍යයන අංශය)
2.පූජ්‍ය මහාචාර්ය තැරැලේ ධම්මරතන හිමි (කැලණිය විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයනාංශ ප්‍රධාන)

**ආයතනයේ එක් එක් අධ්‍යයනාංශයේ ආචාර්යවරු**

1 . මහාචාර්ය පී.ආර්. වසන්ත ප්‍රියදර්ශන මහතා - බෞද්ධ සංස්කෘතිය අධ්‍යයනාංශය

2. පූජ්‍ය ආචාර්ය වඩිනාගල පඤ්ඤාලෝක හිමි - බෞද්ධ මූලාශ්‍රය අධ්‍යයනාංශය

3. ආචාර්ය අශෝක වැලිතොට මහතා - බෞද්ධදර්ශන අධ්‍යයනාංශය

**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබූ සාමාජිකයන්**

1.පූජ්‍ය මහාචාර්ය අගලකඩ සිරිසුමන හිමි
2. පූජ්‍ය ආචාර්ය මැදගම්පිටියේ විජිතධම්ම හිමි
3. මහාචාර්ය රත්න විජේතුංග මහතා
4. වෛද්‍ය අමරසිරි පොන්නම්පෙරුම මහතා
5. ආචාර්ය ප්‍රණීත් අභයසුන්දර මහතා

**කාර්යාලයීය උපස්ථිතියෙන්**

එල්.ඒ.සුමිත් ජයසේකර මහතා - (ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී)

ආරාධිත

**ගීතානී අත්තනායක මහත්මිය (ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී)**

# 06. ආයතනයෙහි පරිපාලන හා අධ්‍යයන ව්‍යුහය

| | |
|---|---|
| 01. අධ්‍යක්ෂ | පූජ්‍ය මහාචාර්ය කොටපිටියේ රාහුල හිමි<br>B.A. (Hons), M.A., PhD |
| 02. ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී | එල්.ඒ. සුමිත් ජයසේකර මහතා<br>B.A.(SJP)<br>PGD (UOC)<br>Dip. in Advanced English (UOC) |
| 03. ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී | ඒ.පී.එස්.එම්. දොලගේ මහත්මිය<br>B.Sc. Business Admn(Sp) (SJP) |
| 05. ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී | එම්.කේ. ගීතානි අත්තනායක මහත්මිය<br>BA. (Special),M.A.(Peradeniya)<br>MLSc. (Colombo) |
| 06. සහකාර ලේඛකාධිකාරී | එම්.බී.වයි.ජී. පෙරේරා මෙනෙවිය (2016.10.03 දින සිට)<br>B.Sc.Business Admn (Sp) (SJP)<br>M.A. (Econ) (Kelaniya) |

**<u>අධ්‍යයනාංශ හා ප්‍රධානවරුන්</u>**

| | |
|---|---|
| බෞද්ධ දර්ශන අධ්‍යයන අංශය | මහාචාර්ය පූජ්‍ය රළුවේ පද්මසිරි හිමි<br>M.A.(National University of Singapore)) |
| බෞද්ධ මූලාශ්‍රය අධ්‍යයන අංශය | මහාචාර්ය ඩබ්ලිව්.එම්. දේශප්‍රිය ගුණසේන මහතා<br>Doctor of Philosophy<br>M.A. (Linguistics) (SJP) |
| බෞද්ධ සංස්කෘතිය අධ්‍යයන අංශය | මහාචාර්ය පූජ්‍ය මිරිස්වත්තේ විමලඥාණ හිමි<br>MPhil. (Peradeniya) |

# 07. කාර්ය මණ්ඩල විස්තර - 2016

| පීඨය/අංශය | ජ්‍යෙෂ්ඨත්වයෙන් වැඩි | කාර්ය මණ්ඩලය | කණිෂ්ඨ කාර්ය මණ්ඩලය | සුළු සේවක |
|---|---|---|---|---|
| අධ්‍යක්ෂ | අධ්‍යක්ෂ - 01 | ලිපිකරු iii ශ්‍රේණිය - 01 | -- | |
| අධ්‍යයනාංශ<br><br>**01.** බෞද්ධ මූලාශ්‍රය අධ්‍යයන අංශය<br>**02.** බෞද්ධ දර්ශන අධ්‍යයන අංශය<br>03.බෞද්ධ සංස්කෘතියඅධ්‍යයන අ | - | | | |
| ආයතන අංශය | ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී - 01 | ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික සහකාර (ලඝුලේඛක-සිංහල)-01<br>ලිපිකරු iii ශ්‍රේණිය - 01 | **කාර්යාල යන්ත්‍ර ක්‍රියාකරු - 01** | කාර්යාල කාර්ය සහයක - 01<br><br>කම්කරු(විශේෂ ශ්‍රේණිය ) - 01<br>කම්කරු (iii ශ්‍රේණිය) – 01 |
| විභාග හා ශිෂ්‍ය කටයුතු අංශය | | පරිගණක යෙදවුම් සහකාර iii ශ්‍රේණිය -02 | | කම්කරු iii ශ්‍රේණිය -01 |
| පාලන අංශය | සහකාර ලේඛකාධිකාරී - 01 | පුහුණුවන පරිගණක යෙදවුම් සහකාර - 01 | රියැදුරු ii ශ්‍රේණිය - 02 (මෙම තනතුරු 02න් 01ක් පුරප්පාඩු වී ඇති අතර එය 2017.03.01 දින සිට බඳවා ගැනීමට නියමිතය.) | |

| | | | | |
|---|---|---|---|---|
| ගිණුම් අංශය | ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී - 01 | 1.ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික සහකාර (ලිපිකරු) - 01<br>2.ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික සහකාර (පොත් තබන්නා) - 01<br>3. ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික සහකාර (සරප්) - 01<br>ගබඩා භාරකරු ii ශ්‍රේණිය - 01<br>පුහුණුවන පරිගණක යෙදවුම් සහකාර -01 | | |
| පුස්තකාලය | ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී - 01 (i ශ්‍රේණිය) | පුස්තකාල සහකාර iii ශ්‍රේණිය - 02 | පුස්තකාල සේවක ii ශ්‍රේණිය - 02 (2016.06.15 දින සිට 01ක් පුරප්පාඩු වී ඇත.) | |

# 08. විගණන කමිටුව

ආයතනයේ විගණන කමිටුව පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත වේ.

1. ආර්.එම්.එස්.පී.එස්. බණ්ඩාර මහතා - අධ්‍යක්ෂ (සභාපති)
 - මහා භාණ්ඩාගාර නියෝජිත
2. පී.ජී. ජයසිංහ මහතා - අතිරේක ලේකම් - උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය (උසස් අධ්‍යාපන අංශය)
3. මහාචාර්ය විමල් ජී. බලගල්ලේ මහතා - විශ්වවිද්‍යාලය ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත් කළ
4. එස්.එම්.එස්. සමරවීර මහත්මිය - ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක
5. එච්.ඒ.ඩී. චාන්දනී මහත්මිය - විගණන අධිකාරී - රජයේ විගණන අංශය
7. එම්.එම්.ජේ.ආර්. බෝගමුව මහතා - ප්‍රධාන අභ්‍යන්තර විගණක විශ්වවිද්‍යාලය ප්‍රතිපාදන කොමිෂන් සභාව

<u>කාර්යාලයීය උපස්ථිතියෙන්</u>

එල්.ඒ.සුමිත් ජයසේකර මහතා - ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී - ලේකම්
ඒ.පී.එස්.එම්. දොළගේ මහත්මිය - ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී
ගීතානී අත්තනායක මහත්මිය - ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී
එම්.බී.වයි.ජී. පෙරේරා මෙනෙවිය - සහකාර ලේඛකාධිකාරී

# 09. පාඨමාලා පිළිබඳ විස්තර

වර්තමානයේ පහත සඳහන් පාඨමාලා හා පර්යේෂණ වැඩසටහන් සිංහල හා ඉංග්‍රීසි යන මාධ්‍ය දෙකෙන්ම ක්‍රියාත්මක වේ.

| Course ID | Course Name(English) | Course Name (Sinhala) |
|---|---|---|
| 01 | Postgraduate Diploma in Buddhist Studies | බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව |
| 02 | Master of Arts Degree in Buddhist Studies | බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව |
| 03 | Postgraduate Diploma in Pali Studies | පාලි අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව |
| 04 | Master of Arts Degree in Pali Studies | පාලි අධ්‍යයන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව |
| 05 | Master of Philosophy in Buddhist Studies (MPhil.) | බෞද්ධ අධ්‍යයන දර්ශනපති උපාධිය |
| 06 | Doctor of Philosophy in Buddhist Studies (PhD) | බෞද්ධ අධ්‍යයන දර්ශන විශාරද උපාධිය |
| 07 | Postgraduate Diploma in Buddhist Ayurvedic Counselling | බෞද්ධායුර්වේද උපදේශන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව |
| 08 | Master of Arts Degree in Buddhist Ayurvedic Counselling | බෞද්ධායුර්වේද උපදේශන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව |
| 09 | Basic Pali& Sanskrit Course<br>To be commenced in 2017 | |
| 10 | English Through Buddhism | |

# 10. ශිෂ්‍ය තොරතුරු - 2016

## සිංහල මාධ්‍යය

| පාඨමාලාව | ලියාපදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාව | විභාගයට පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | සමත් ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|---|
| බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව | 13 | 11 | 11 |
| බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව | 91 | 75 | 68 |
| පාලි අධ්‍යයන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව | 04 | 04 | 04 |
| බෞද්ධායුර්වේද උපදේශන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව | 26 | 22 | 22 |
| බෞද්ධායුර්වේද උපදේශන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව | 47 | 43 | 42 |

## ඉංග්‍රීසි මාධ්‍යය

| පාඨමාලාව | ලියාපදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාව | විභාගයට පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | සමත් ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|---|
| බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව | 26 | 24 | 23 |
| බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව | 264 | 252 | 221 |
| බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව (සිංගප්පූරුව) | 10 | 10 | 10 |
| බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව (සිංගප්පූරුව) | 03 | 02 | 02 |
| බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව (හොංකොං) | 43 | 21 | 12 |

**පර්යේෂණ උපාධි හදාරන ශිෂ්‍ය සංඛ්‍යාව**

| උපාධිය | සිංහල මාධ්‍යය | ඉංග්‍රීසි මාධ්‍යය |
|---|---|---|
| බෞද්ධ අධ්‍යයන දර්ශනපති උපාධිය (MPhil.) | 64 | 71 |
| බෞද්ධ අධ්‍යයන දර්ශනවිශාරදඋපාධිය (PhD) | 14 | 34 |

## 11.පාඨමාලා සහ ශිෂ්‍ය සංඛ්‍යාව




## 12. <u>සමත්වූ ශිෂ්‍ය සංඛ්‍යාව</u>

| | වර්ෂය | දේශීය | විදේශීය |
|---|---|---|---|
| 01 | 2012 | 164 | 133 |
| 02 | 2013 | 186 | 134 |
| 03 | 2014 | 285 | 128 |
| 04 | 2015 | 146 | 165 |
| 05 | 2016 | 154 | 261 |



# 13. මානව සම්පත් හා ශිෂ්‍ය සංඛ්‍යාව - 2016

<table>
<tr><th>පාඨමාලාව</th><th>ලියාපදිංචි මුළු ශිෂ්‍ය සංඛ්‍යාව</th><th>අධ්‍යයන කාර්ය මණ්ඩලය</th></tr>
<tr><td>බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව (සිංහල මාධ්‍යය)</td><td>13</td><td rowspan="11">අධ්‍යක්ෂ<br>මහාචාර්ය - 04<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - 02<br>ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී<br>විද්‍යාත්මක සහකාර - 01<br>බාහිර කථිකාචාර්යවරුන්</td></tr>
<tr><td>බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව (ඉංග්‍රීසි මාධ්‍යය)</td><td>26</td></tr>
<tr><td>බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති පාඨමාලාව (සිංහල මාධ්‍යය)</td><td>91</td></tr>
<tr><td>බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති පාඨමාලාව (ඉංග්‍රීසි මාධ්‍යය)</td><td>264</td></tr>
<tr><td>පාලි අධ්‍යයන ශාස්ත්‍රපති පාඨමාලාව (සිංහල මාධ්‍යය)</td><td>04</td></tr>
<tr><td>බෞද්ධායුර්වේද උපදේශන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව (සිංහල මාධ්‍යය)</td><td>26</td></tr>
<tr><td>බෞද්ධායුර්වේද උපදේශන ශාස්ත්‍රපති පාඨමාලාව (සිංහල මාධ්‍යය)</td><td>47</td></tr>
<tr><td>බෞද්ධ අධ්‍යයන දර්ශනපති උපාධිය (සිංහල මාධ්‍යය)</td><td>64</td></tr>
<tr><td>බෞද්ධ අධ්‍යයන දර්ශනපති උපාධිය (ඉංග්‍රීසි මාධ්‍යය)</td><td>71</td></tr>
<tr><td>බෞද්ධ අධ්‍යයන දර්ශන විශාරද උපාධිය (සිංහල මාධ්‍යය)</td><td>14</td></tr>
<tr><td>බෞද්ධ අධ්‍යයන දර්ශන විශාරද උපාධිය (ඉංග්‍රීසි මාධ්‍යය)</td><td>34</td></tr>
<tr><td>බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති පාඨමාලාව - බාහිර ( ඉංග්‍රීසි මාධ්‍යය)</td><td>46</td><td></td></tr>
<tr><td>බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව- බාහිර ( ඉංග්‍රීසි මාධ්‍යය)</td><td>10</td><td></td></tr>
</table>

# 14. පාඨමාලා සම්පූර්ණ කළ දේශීය ශිෂ්‍යයෝ - 2016

| පාඨමාලාව | මාධ්‍යය | විභාගයට පෙනී සිටි (2015) | 2016 වර්ෂයේ විභාගයට පෙනී සිටි |
|---|---|---|---|
| බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව | සිංහල | 08 | 11 |
| බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව | ඉංග්‍රීසි | 04 | 02 |
| බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති පාඨමාලාව | සිංහල | 56 | 75 |
| බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති පාඨමාලාව | ඉංග්‍රීසි | 07 | 09 |
| පාලි අධ්‍යයන ශාස්ත්‍රපති පාඨමාලාව | සිංහල | 04 | 04 |
| බෞද්ධායුර්වේද උපදේශන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව | සිංහල | 44 | 22 |
| බෞද්ධායුර්වේද උපදේශන ශාස්ත්‍රපති පාඨමාලාව | සිංහල | 49 | 43 |
| බෞද්ධ අධ්‍යයන දර්ශනපති පාඨමාලාව | සිංහල | 01 | 01 |
| බෞද්ධ අධ්‍යයන දර්ශනපති පාඨමාලාව | ඉංග්‍රීසි | -- | -- |
| බෞද්ධ අධ්‍යයන දර්ශන විශාරද පාඨමාලාව | සිංහල | 03 | 06 |
| බෞද්ධ අධ්‍යයන දර්ශන විශාරද පාඨමාලාව | ඉංග්‍රීසි | 06 | 06 |

# 15. පාඨමාලා සම්පූර්ණ කළ විදේශීය ශිෂ්‍යයෝ - 2016

| පාඨමාලාව | මාධ්‍යය | 2015වර්ෂයේ විභාගයට පෙනී සිටි | 2016වර්ෂයේ විභාගයට පෙනී සිටි |
|---|---|---|---|
| බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව | ඉංග්‍රීසි | 20 | 22 |
| බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති පාඨමාලාව | ඉංග්‍රීසි | 165 | 212 |
| බෞද්ධ අධ්‍යයන දර්ශනපති පාඨමාලාව | ඉංග්‍රීසි | -- | -- |
| බෞද්ධ අධ්‍යයන දර්ශන විශාරද පාඨමාලාව | ඉංග්‍රීසි | 05 | -- |
| බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව -බාහිර | ඉංග්‍රීසි | 07 | 10 |
| බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති පාඨමාලාව - බාහිර | ඉංග්‍රීසි | 24 | 23 |
| | | 216 | 267 |

# 16. කුසලතා සම්මාන ප්‍රදාන

| විෂය | තිළිණ ප්‍රමාණය | ප්‍රදානය |
|---|---|---|
| (අ) දේශීය/ විදේශීය තිළිණ ලාභීන් | 01 | ස්වර්ණ මුද්‍රිකාව - (බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති (සිංහල) පාඨමාලාවේ වැඩිම ලකුණු ලාභියා) ගමගේ දෝන චින්තා රන්සිරිනි ජේමරත්න මහත්මිය |
| | 01 | රජත මුද්‍රිකාව - (බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා (සිංහල) පාඨමාලාවේ වැඩිම ලකුණු ලාභියා) ඒකනායක මුදියන්සේලාගේ සමන්ත කුමාර සෙනවිරත්න මහතා |
| (ආ) ඊ.ඩබ්ලිව්.ගුණතිලක ශිෂ්‍යත්ව අරමුදල | 01 | ඒකනායක මුදියන්සේලාගේ සමන්ත කුමාර සෙනවිරත්න මහතා |
| (ඇ) මහායාන අධ්‍යයනයෙහි දක්ෂතා දක්වන සිසුන් සඳහා පිරිනමන ශිෂ්‍යත්වය | 02 | 1. පූජ්‍ය අලුයටවල විමලධම්ම හිමි<br>2. Ven. Khemasiri |

# 17. අධ්‍යයන කාර්ය මණ්ඩලය - 2016

| දෙපාර්තමේන්තුව | මාධ්‍යය | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | මහාචාර්ය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | කථිකාචාර්ය | විද්‍යාත්මක සහකාර ii ශ්‍රේණිය |
|---|---|---|---|---|---|---|
| බෞද්ධ දර්ශනය අධ්‍යයන අංශය | | - | 01 | 01 | - | - |
| බෞද්ධ සංස්කෘතිය අධ්‍යයන අංශය | | - | 02 | - | - | - |
| බෞද්ධ මූලාශ්‍රය අධ්‍යයන අංශය | | - | 01 | 01 | - | - |
| පර්යේෂණ අංශය | | - | - | - | - | 01 |



# 18. 2016 වර්ෂයේදී ප්‍රදානය කරන ලද පර්යේෂණ උපාධි

| නම | උපාධිය | පර්යේෂණ උපාධි මාතෘකාව | අපේක්ෂයාගේ රට |
|---|---|---|---|
| නයනා කුමාරි ආරියරත්න මෙනවිය | දර්ශන විශාරද (සිංහල) | ආදී බුදුදහමේ හා පශ්චාත් කාලීන බෞද්ධ දර්ශන සම්ප්‍රදායන්හි එන පරමාර්ථ ධර්ම සංකල්පය පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක් | ශ්‍රී ලංකාව |
| ජී.ඩබ්ලිව්. නිසංසලා මධුහංසි මහත්මිය | දර්ශන විශාරද (සිංහල) | මානව සංවර්ධනය පිළිබඳ බෞද්ධ හා නූතන ආකල්ප - තුලනාත්මක අධයයනයක් | ශ්‍රී ලංකාව |
| මියුරි මල්ලිකා දළුවත්ත මහත්මිය | දර්ශන විශාරද (සිංහල) | ශ්‍රී ලාංකික ඉතිහාසය තුළ ධාර්මික සංකල්පය ක්‍රියාත්මක වූ ආකාරය පිළිබඳ විග්‍රහාත්මක අධ්‍යයනයක් (අනුරාධපුර පොළොන්නරු යුග ඇසුරින්) | ශ්‍රී ලංකාව |
| එන්.බී.ඩී.එන්.බී. බලල්ලේ මහතා | දර්ශන විශාරද (සිංහල) | රෝම ලන්දේසි දිලික්ත නීතියෙන් පැනෙන අවධානීය යුතුකම හා බෞද්ධ දර්ශනයේ විග්‍රහ වන යුතුකම පිළිබඳ අවධාරණය (තුලනාත්මක අධ්‍යයනයක්) | ශ්‍රී ලංකාව |
| ඩී.එන්.ඩබ්.ජී. ඕපාත මහතා | දර්ශන විශාරද (සිංහල) | ශ්‍රී ලංකාවේ දේශපාලනික භාවිත විෂයෙහි බලපෑ බෞද්ධ සංස්කෘතික සාරධර්ම පිළිබඳ විචාරාත්මක අධ්‍යයනයක් | ශ්‍රී ලංකාව |
| ඒ.වී. මාලනි මහත්මිය | දර්ශන විශාරද (සිංහල) | දැනුම් කළමනාකරණය පිළිබඳ විචාරාත්මක අධ්‍යයනයක් | ශ්‍රී ලංකාව |
| Mrs. Soma Subhashini De Silva | දර්ශන විශාරද (ඉංග්‍රීසි) | Counseling for Interpersonal Conflict: A Psychological Model Based on Buddhist Principles | ශ්‍රී ලංකාව |
| Ven. Pang Yahui | දර්ශන විශාරද (ඉංග්‍රීසි) | A Critical Study of the Multicultural Elements in Buddhist Social Philosophy and Ethics | චීනය |
| Ven. Li Xia | දර්ශන විශාරද (ඉංග්‍රීසි) | A Critical Study of the Psychological Importance of the Theravada Analysis of Mind with reference to the Early Buddhism | චීනය |
| Ven. Da Xing | දර්ශන විශාරද (ඉංග්‍රීසි) | A Comparative Study of the Buddhist Noble Eightfold Path and the Aṣṭāṅga–Yoga in Yoga System | චීනය |
| Ven. AshinIndaka | දර්ශන විශාරද (ඉංග්‍රීසි) | A Critical Study of the Development of Early Buddhist Psychological Concepts in the Pali Commentarial Literature | මියන්මාරය |
| Ven. Anula | දර්ශන විශාරද (ඉංග්‍රීසි) | The Relevance of the Analysis of Five Aggregates in Buddhist Meditation – A Critical Study | කොරියාව |
| පූජ්‍ය ඇකිරියේ චූලාලංකාර හිමි | දර්ශනපති (සිංහල) | බුදු දහම මහායානයට පරිවර්තනය වන අන්තර්මධ්‍ය අවස්ථාවක් නියෝජනය කරන වෛපුල්‍ය සූත්‍ර පිළිබඳ විරාත්මක අධ්‍යනයක් | ශ්‍රී ලංකාව |

# 19. ප්‍රකාශන

වාර්ෂික ප්‍රකාශනයක් ලෙස එළිදැක්වෙන අන්වේෂණ ශාස්ත්‍රීය සංග්‍රහය 2015 වර්ෂයේදීද සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් සංස්කරණ දෙකක් ලෙස ප්‍රකාශයට පත් කරන ලදී. ඊට අමතරව හසුන්පත (News letter) ප්‍රකාශයට පත් කරන ලදී.

# 20. පුස්තකාලය

පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ මූලික මෙහෙවර වන්නේ බෞද්ධ පශ්චාත් උපාධි අධ්‍යයන සඳහා සුදුසු අවස්ථා ඇති කර දීම හා ඒවාට උදව් කිරීම, බෞද්ධ අධ්‍යයන කෙරෙහි වඩාත් ඵලදායි ආකල්පයක් ඇති කිරීම හා බෞද්ධ අධ්‍යයන ක්ෂේත්‍රයේ පර්යේෂණ නිපුණතා වැඩි දියුණු කිරීම වේ. මෙම මෙහෙවර සාධනය කර ගැනීමෙහි ලා පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතන පුස්තකාලය වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. ඒ අනුව ආයතනයේ අධ්‍යයන හා පර්යේෂණ කටයුතුවල නියැලෙන විද්‍යාර්ථීන්ට හා අධ්‍යයන කාර්ය මණ්ඩලයට අවශ්‍ය ප්‍රාථමික හා ද්විතීයික තොරතුරු මූලාශ්‍රය සහ වෙනත් අදාළ පහසුකම් සැපයීම පුස්තකාලයේ ප්‍රධාන කාර්යභාරය වේ. මෙයට අතිරේකව බාහිර පුස්තකාල සාමාජිකත්වය යටතේ දේශීය හා විදේශීය පර්යේෂකයින්ට අවශ්‍ය විමර්ශන පහසුකම් ද පුස්තකාලය මගින් සැපයේ.

මේ වන විට ආයතන පුස්තකාලය සතුව ග්‍රන්ථ 22,000ක් පමණ තිබේ මේ අතරින් 90%ක් පමණ ම බෞද්ධ පොතපත වීම මෙහි දක්නට ලැබෙන සුවිශේෂතාවයකි.පශ්චාත් උපාධි අධ්‍යයන පාඨමාලාවන්ට හා බෞද්ධ පර්යේෂණ මාතෘකාවන්ට අනුගතවනසේ පුස්තකාල ද්‍රව්‍ය එක්රැස් කෙරේ.

ඒ නිසාම බුදුදහම සහ එහි ප්‍රභේද කෙරෙහිත් පාලි භාෂාව, පාලි සාහිත්‍යය, බෞද්ධ කලා ශිල්ප, බෞද්ධ දර්ශනය ආදී විෂයයන් කෙරෙහිත් වැඩි අවධානයක් යොමු කර ග්‍රන්ථ අත්පත් කර ගනු ලැබේ. මීට අමතරව බුදුදහම හා සම්බන්ධ නව විශ්වකෝෂ, ශබ්ද කෝෂ ආදී විමර්ශන කෘතීන් ද පාඨක පරිහරණය සඳහා යොමු කොට තිබේ.

එමෙන් ම භාෂා මාධ්‍යය හතකින් (පාලි, සිංහල, ඉංග්‍රීසි, බුරුම, කාම්බෝජ්, දේවනාගිරි, තායි) මුද්‍රිත ථෙරවාද ත්‍රිපිටකය හා චීන ආගම පිළිබඳ තයිෂෝ මුද්‍රණය ද තිබේ.

පර්යේෂණ උපාධිධාරීන් විසින් ආයතනය වෙත ඉදිරිපත් කරන ලද දර්ශනපති හා ආචාර්ය උපාධි නිබන්ධන පුස්තකාලයේ තැන්පත් කොට ඇත.

## <u>පුස්තකාල සේවාවන්</u>

**පහත සඳහන් සේවාවන් මූලික වශයෙන් පාඨකයන් වෙත සපයා ඇත.**
විමර්ශන සේවාව
පොත් බැහැරදීමේ සේවාව
ඡායාපිටපත් සේවාව
අන්තර්ජාල පහසුකම්
පරිගණක භාවිතය හා මුද්‍රණ පිටපත් ලබාදීමේ සේවාව
අන්තර් පුස්තකාල පිරුළු සේවාව
උපාධි නිබන්ධන බැඳුම් සේවාව

## <u>පුස්තකාලයේ ලියාපදිංචි පාඨක සංඛ්‍යාව</u>

බාහිර පාඨකයින් සඳහා විමර්ශන පහසුකම් පමණක් සපයා ඇති අතර සෙසු පාඨකයින් සඳහාවිමර්ශන සහ පොත් බැහැර දීමේ පහසුකම් සපයනු ලැබේ. ඒ අනුව පහත සහන් පරිදි පුස්තකාල සාමාජිකත්වය 2016 වර්ෂය සඳහා ලබා ගෙන ඇත.

| | |
|---|---|
| ආචාර්ය මණ්ඩලය | - 07 |
| අනධ්‍යයන කාර්ය මණ්ඩලය | - 20 |
| පශ්චාත් උපාධි අපේක්ෂකයින් | - 466 |
| බාහිර පාඨකයින් සහා සේවා සැපයීම | - 38 |
| එකතුව | - 531 |

## <u>කාර්ය මණ්ඩල සංයුතිය</u>

ඉහත සඳහන් පාඨක සංඛ්‍යාව සඳහා සියලුම සේවාවන් සැපයීම පහත සඳහන් කාර්ය මණ්ඩලය විසින් සපයනු ලැබේ.

| | |
|---|---|
| ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී | - 01 |
| පුස්තකාල සහකාර | - 01 |
| පුස්තකාල සහායක | - 02 |
| එකතුව | - 04 |

## <u>2016 වර්ෂය තුළදී පොත් මිලදී ගැනීම හා පරිත්‍යාග ලෙස ලැබීම්</u>

ආයතනයේ වාර්ෂික ප්‍රතිපාදනවලින් දේශීය සහ විදේශීය වශයෙන් පොත් මිලදී ගැනීම සහ පරිත්‍යාග ලෙස ලැබීම් පහත සහන් පරිදිය.

| | |
|---|---|
| මිල දී ගත් පොත් ගණන | - 907 |
| පරිත්‍යාග ලෙස ලැබුණු පොත් ගණන | - 813 |
| එකතුව | -1720 |

## 21. පර්යේෂණ ඒකකය

### පූජ්‍ය මඩිහේ සුගතසිරි හිමි - විද්‍යාත්මක සහකාර

දර්ශනපති සහ ආචාර්ය උපාධි පර්යේෂණ නිබන්ධ පිළිබඳ පරීක්ෂකවරුන් විසින් යෝජිත සංශෝධන අපේක්ෂකයින් විසින් නිවැරදිව සිදු කරන ලද දැයි පරීක්ෂා කර බලා වාර්තා කිරීම සහ පර්යේෂණ අධ්‍යයනයන්හි නිරතව සිටින ශිෂ්‍යයින් වෙනුවෙන් විශේෂ සම්මන්ත්‍රණ මාලා සංවිධානය කිරීම මෙන් ම පොදුවේ පර්යේෂණ ශිෂ්‍යයින්ට ස්වකීය පර්යේෂණ කටයුතු කර ගෙන යාම සඳහා මඟ පෙන්වීම මෙම ඒකකය මගින් සිදු කෙරේ.

## 22. අධ්‍යයන චාරිකාව

2016 වර්ෂයේ ඔක්තෝබර් මස 19 සහ 20 දෙදින විදේශීය ශිෂ්‍යයන් සඳහා වූ අධ්‍යයන චාරිකාව පොළොන්නරුව ඓතිහාසික නගරය ආශ්‍රිතව සිදු කරන ලදි. ඒ සඳහා 130ක් පමණ පිරිසක් සහභාගි වූ අතර පන්ති කාමරයේ න්‍යායික දැනුම ප්‍රායෝගික ක්‍රියාකාරකම් ලෙස ක්ෂේත්‍ර අධ්‍යයන ස්වරූපයකින් ක්‍රියාත්මක විය. අධ්‍යයන කාර්ය මණ්ඩලය බාහිර විද්වතුන්ගේ ද සහභාගිත්වය ඇතිව සම්පත් දායකත්වය ලබාදුන් අතර ශිෂ්‍ය ප්‍රජාවේ අපේක්ෂා ඵල ගන්වන අන්දමින් අධ්‍යයන චාරිකාව සාර්ථකව දින දෙකක් පුරාවට පැවැත්විණ.





## 23. සම්මන්ත්‍රණ

භික්ෂු විනය, කතිතාවත් හා නූතන අභියෝග මැයෙන් වූ කාලීන මාතෘකාව යටතේ ජාතික සම්මන්ත්‍රණයක් 2016.11.29 දින ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී පවත්වන ලදී.

ක්ෂේත්‍රයේ ප්‍රමාණික විද්වතුන් රාශියකගේ සහභාගිත්වයෙන් පවත්වන ලද වැඩසටහන සැසිවාර හතරකින් සමන්විතව දවස පුරා පැවැත්විණි. පළමු වැඩසටහන අවසානයේ මීළඟ වැඩ සටහන සඳහා පදනම් වූ කරුණු පිළිබඳව අවධානය යොමු වූ අතර දෙවන වැඩසටහන 2017 වර්ෂයේදී පැවැත්වීමට තීරණය විය.

# 24. පුනරාවර්තන වියදම්

| විෂයය | 2015 රු.ශත | 2016 රු.ශත | වෙනස |
|---|---|---|---|
| (අ) වැටුප් හා වේතන | 32,457,600 | 40,629,392 | 8,171,792 |
| (ආ) ගමන් වියදම් | 159,458 | 1,184,729 | 1,025,291 |
| (ඇ) සැපයුම් | 1,474,586 | 1,280,809 | -193,777 |
| (ඈ) නඩත්තු | 888,180 | 1,138,048 | 249,868 |
| (ඉ) බැඳුම්ගත සේවා | 13,407,246 | 15,123,678 | 1,716,432 |
| (ඊ) වෙනත් | 15,887,083 | 27,903,405 | 12,016,322 |
| එකතුව | 64,274,133 | 87,260,061 | 22,985,928 |

# 25.ප්‍රාග්ධන වියදම්

| විෂයය | 2015 (රු.ශත) | 2016 (රු.ශත) | වෙනස |
|---|---|---|---|
| (අ) ලී බඩු සහ කාර්යාලයීය උපකරණ මිළදී ගැනීම. | 3,829,292 | 1,167,683 | -2,661,609 |
| (ආ) යන්ත්‍ර උපකරණ මිළදී ගැනීම. | 0 | 0 | 0 |
| (ඉ) ගොඩනැගිලි | 0 | 0 | 0 |
| (ඊ) වෙනත් | 691,431 | 1,118,489 | 427,058 |
| එකතුව | 4,520,723 | 2,286,172 | -2,234,551 |

# 26. මූල්‍යමය ප්‍රගතිය (වියදම්)

| විෂයය | අයවැයගත වෙන් කිරීම් | | වියදම | | අතිරික්ත/ඌනතාව (රු.ශත) | |
|---|---|---|---|---|---|---|
| | 2015 | 2016 | 2015 | 2016 | 2015 | 2016 |
| (අ) පුනරාවර්තන (ව්‍යාපෘති හැර) | 60,526,200 | 57,200,000 | 55,448,860 | 70,327,036 | 5,077,340 | -13,127,036 |
| (ආ) ප්‍රාග්ධන (ව්‍යාපෘති හැර) | 2,750,000 | 2,750,000 | 4,520,723 | 2,286,172 | -1,770,723 | 463,828 |
| (ඇ) ව්‍යාපෘති - දේශීය ආයෝජන | 6,200,000 | 12,800,000 | 8,825,274 | 16,933,025 | -2,625,274 | -4,133,025 |
| (ඇ) ව්‍යාපෘති - විදේශීය ආයෝජන | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| එකතුව | 69,476,200 | 72,750,000 | 68,794,857 | 89,546,233 | 681,343 | -16,796,233 |

# 27. මූල්‍යමය ප්‍රගති විස්තරය (උපයන ලද ආදායම)

| ආදායම් මාර්ග | වෙන් කිරීම් (රු. ශත) | | එකතුව (රු.ශත) ආදායම | | වෙන් කිරීම් (රු.ශත) | එකතුව (රු.ශත)ආදායම |
|---|---|---|---|---|---|---|
| | 2015 | 2016 | 2015 | 2016 | 2015 | 2016 |
| (අ) උපාධි අපේක්ෂක | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| (ආ) පශ්චාත් උපාධි | 31,070,000 | 57,200,000 | 25,789,893 | 36,830,886 | 5,280,107 | 20,369,114 |
| (ඇ) උපදේශන සේවා | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| (ඈ) වෙනත් | 6,160,000 | 12,800,000 | 14,134,102 | 19,156,064 | -7,974,102 | -6,356,064 |
| එකතුව | 37,230,000 | 70,000,000 | 39,923,995 | 55,986,950 | -2,693,995 | 14,013,050 |

## 28. මූල්‍ය ප්‍රගති විශ්ලේෂණය - 2016

| විෂයය | ක්‍රමය | එක් සිසුවකු සඳහා වියදම | |
|---|---|---|---|
| | | 2015 | 2016 |
| (අ) එක් සිසුවකු සඳහා පුනරාවර්තන වියදම | පුනරාවර්තන වියදම<br>ශිෂ්‍ය සංඛ්‍යාව | 92,348 | 110,456 |
| (ආ) එක් සිසුවකු සඳහා ප්‍රාග්ධන වියදම | ප්‍රාග්ධන වියදම<br>ශිෂ්‍ය සංඛ්‍යාව | 6,477 | 2,894 |
| එකතුව | | 98,825 | 113,350 |

## 29. වාර්තාව සඳහා අදාළ වෙනත් තොරතුරු

01. අවසාන ගිණුම් - 2016
02. 2012- 2016 දක්වා ආයතනයේ මූල්‍ය තත්වය.
03. කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(02) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව සහ පිළිතුරු.

## 30. 2012 – 2016 දක්වා ආයතනයේ මූල්‍ය තත්වය

| වර්ෂය | පුනරාවර්තන සඳහා රජයේ ආධාර | 102 - මූලධන සඳහා රජයේ ආධාර | තොරතුරු තාක්ෂණ සඳහා රජයේ ආධාර | ආයතනික ඉපයීම් | මුළු පුනරාවර්තන ආදායම | මුළු පුනරාවර්තන වියදම | පුනරාවර්තන මූල්‍යකටයුතු වල ප්‍රතිඵලය |
|---|---|---|---|---|---|---|---|
| **2012** | **6,500,000** | **1,600,000** | **--** | **25,864,163** | **32,364,163** | **35,074,132** | **-2,709,969** |
| **2013** | **11,417,000** | **2,550,000** | **--** | **26,474,565** | **37,891,565** | **41,359,197** | **-3,467,632** |
| **2014** | **24,150,000** | **2,000,000** | **--** | **30,109,778** | **54,259,778** | **55,041,448** | **(781,671)** |
| **2015** | **12,000,000** | **2,750,000** | **--** | **45,303,098** | **57,303,098** | **64,274,134** | **(6,971,036)** |
| **2016** | **23,400,000** | **6,400,000** | **--** | **61,874,729** | **85,274,729** | **87,260,061** | **(1,985,332)** |

# පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය
# (කැලණිය විශ්වවිද්‍යාලය)

## මූල්‍ය ප්‍රකාශනය - 2016

# 31. 2016 වර්ෂය සඳහා මූල්‍ය කටයුතු පිළිබඳ වාර්තාව

පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය - කැලණිය විශ්වවිද්‍යාලය

වාර්තා කිරීමේ ආයතනය

කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත සහ 1979 අංක 08 දරන පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය ආඥාපනත යටතේ සංස්ථාපනය කරනු ලැබ ඇත.

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය කටයුතු පිළිබඳ වාර්තා තිස් අටක් (38) සම්පාදනය කරනු ලැබ ඇත.

2016 වර්ෂය සඳහා ලබා ගෙන ඇති ප්‍රතිපාදන වෙන්කිරීම් පහතින් දක්වා ඇත.

පුනරාවර්තන වෙන් කිරීම් රු.23,400,000.00

102 ප්‍රාග්ධන වෙන් කිරීම් රු.64,000,000.00

රජයේ ප්‍රදාන ඇතුළත්ව, මෙම වර්ෂයේ සමස්ත පුනරාවර්තන ආදායම රු.85,274,729/-ක් වූ අතර, පුනරාවර්තන වියදම රු.87,260,061/-ක් විය. ඒ අනුව, පුනරාවර්තන මූල්‍ය කටයුතුවල ප්‍රතිඵලය ලෙස රු.1,985,332/-ක හිඟයක් විය.

මහාචාර්ය පූජ්‍ය කොටපිටියේ රාහුල හිමි
අධ්‍යක්ෂ

**පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය**
**කැලණිය විශ්වවිද්‍යාලය**
**2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව**

| වත්කම් | සටහන් | 2016 | | 2015 | |
|---|---|---|---|---|---|
| ජංගම නොවන වත්කම් (උපලේඛනය H) | | රු. | රු. | රු. | රු. |
| දේපල, යන්ත්‍රෝපකරණ සහ ආම්පන්න | 01 | 10,691,163 | | 13,036,753 | |
| ආයෝජන | 02 | 12,241,876 | | 11,307,256 | |
| වෙනත් මූල්‍ය වත්කම් | 03 | 1,031,858 | | 953,046 | |
| | | | **23,964,897** | | **25,297,055** |
| **ජංගම වත්කම්** | | | | | |
| ගබඩා අත්තිකාරම් ගිණුම | 04 | 534,470 | | 519,159 | |
| ගබඩා ගිණුම (පොත් මුද්‍රණය) | 05 | 1,611,049 | | 1,054,635 | |
| සුළු ණයගැතියන් | 06 | 589,946 | | 402,027 | |
| කාර්ය මණ්ඩලය වෙත ණය සහ අත්තිකාරම් | 07 | 3,125,867 | | 3,930,904 | |
| විවිධ අත්තිකාරම් | 08 | 3,509 | | 1,011 | |
| පෙර ගෙවුම් | 09 | 55,471 | | 78,720 | |
| මුදල් සහ මුදල් සමානයන් | 10 | 27,351,484 | | 8,012,202 | |
| වෙනත් | 11 | 65,000 | **33,336,696** | 65,000 | **14,063,658** |
| **මුළු වත්කම්** | | | **57,301,593** | | **39,360,713** |
| | | | | | |
| **වගකීම්** | | | | | |
| **ජංගම වගකීම්** | | | | | |
| තැන්පතු | 12 | 896,689 | | 43,189 | |
| සුළු ණයහිමියන් | 13 | 3,934 | | 367,909 | |
| උපචිත වියදම් | 14 | 6,567,548 | | 1,667,962 | |
| වෙනත් | 15 | 3,748,194 | | 1,208,030 | |
| **ජංගම නොවන වගකීම්** | | | **11,216,365** | | **3,287,090** |
| ප්‍රාග්ධන ප්‍රදාන වැයවීම් | 16 | 15,598,252 | | 15,555,041 | |
| වැය නොවූ ප්‍රාග්ධන ප්‍රදාන | 17 | 6,598,635 | | 957,000 | |
| **සීමා කළ අරමුදල්** | | | **22,196,887** | | **16,512,041** |
| විශේෂ අරමුදල් | 18 | 7,368,961 | | 6,835,041 | |
| පර්යේෂණ ප්‍රදාන | 19 | 1,120,032 | | 1,046,545 | |

| | | | | | |
|---|---|---|---|---|---|
| ත්‍යාග සහ පරිත්‍යාග | 20 | 8,460,187 | | 10,401,003 | |
| වෙනත් | 21 | 11,302,526 | | 5,684,607 | |
| පාරිතෝෂිත සඳහා ප්‍රතිපාදන | 22 | 10,085,124 | | 8,130,310 | |
| | | | **38,336,831** | | **32,097,507** |
| **මුළු වගකීම්** | | | **71,750,083** | | **51,896,637** |
| **දළ වත්කම්** | | | (14,448,490)<br>========= | | (12,535,924)<br>======== |
| | | | | | |
| **දළ වත්කම්/සම කොටස්** | | | | | |
| **ප්‍රාග්ධන ලැබීම්** | | | | | |
| පිළිඇගයීම් ශේෂ ගිණුම | | 1,846,372 | | 1,846,372 | |
| ආයතනවල සාමාන්‍ය ශේෂ ගිණුම | 23 | (16,294,861) | (14,448,490) | (14,382,296) | (12,535,924) |
| | | | | | |
| මුළු දළ වත්කම්/සම කොටස් | | | (14,448,490)<br>========= | | (12,535,924)<br>======== |

මෙම මූල්‍ය වාර්තා සම්පාදනය කිරීමෙහි
සහ ඉදිරිපත් කිරීමෙහි ලා මෙම ආයතනයෙහි
කලමනාකරණ මණ්ඩලය වග කියනු ලබන අතර,
එම මණ්ඩලය සඳහා සහ වෙනුවෙන්
මෙම මූල්‍ය වාර්තාවලට අත්සන් තබා ඇත.

මෙම මූල්‍ය වාර්තා, 1978 අංක 16 දරන
විශ්වවිද්‍යාල පනත සහ ව්‍යවස්ථාපිත
විධිවිධාන හා අනුකූල වේ.

මහාචාර්ය පූජ්‍ය කොටපිටියේ රාහුල හිමි
අධ්‍යක්ෂ
පාලි හා බෞද්ධ අධ්‍යයන
පශ්චාත් උපාධි ආයතනය

කළමනාකරණ මණ්ඩල සාමාජික
පාලි හා බෞද්ධ අධ්‍යයන
පශ්චාත් උපාධි ආයතනය

ඒ.පී.එස්.එම්. දොලගේ මහත්මිය
ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී
පාලි හා බෞද්ධ අධ්‍යයන
පශ්චාත් උපාධි ආයතනය

**පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය**
**කැලණිය විශ්වවිද්‍යාලය**
**2016 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන වාර්තාව**

| | සටහන් | 2016 | | 2015 | |
|---|---|---|---|---|---|
| **ආදායම්** | | රු. | රු. | රු. | රු. |
| රජයේ ආදායම් - පුනරාවර්තන | | 23,400,000 | | 24,150,000 | |
| | | | | | |
| **වෙනත් ආදායම්** | | | | | |
| ණය පොලී | | 138,381 | | 156,796 | |
| විවිධ ලැබීම් | 24 | 2,063,788 | | 1,251,376 | |
| ලියාපදිංචි කිරීමේ ගාස්තු | | 798,000 | | 641,000 | |
| පංති ගාස්තු | | 35,193,386 | | 24,621,393 | |
| විභාග ගාස්තු | | 306,500 | | 101,500 | |
| පුස්තකාල ගාස්තු | | 533,000 | | 426,000 | |
| ප්‍රකාශන අලෙවිය | | 14,872 | | 9,910 | |
| පුස්තකාල දඩ ගාස්තු | | 5,999 | | 7,147 | |
| දීර්ඝ කළ ව්‍යාපෘති ආදායම් | | 16,933,025 | | 12,708,874 | |
| ක්‍රමක්ෂය | 25 | 5,580,693 | | 4,244,470 | |
| වෙනත් මෙහෙයුම් ආදායම් | 25 | 307,086 | | 1,134,633 | |
| **මුළු ආදායම** | | | **85,274,729** | | **57,303,098** |
| | | | | | |
| **වියදම්** | | | | | |
| පෞද්ගලික වේතන - අධ්‍යයන | 25 | 16,452,206 | | 16,320,780 | |
| පෞද්ගලික වේතන - අනධ්‍යයන | 25 | 24,177,186 | | 16,136,820 | |
| ගමනාගමන | | 1,184,729 | | 159,438 | |
| සැපයුම් | | 1,280,809 | | 1,474,586 | |
| නඩත්තු | | 1,138,048 | | 888,180 | |
| කොන්ත්‍රාත් සේවා | | 15,123,678 | | 13,407,246 | |

| | | | | | |
|---|---|---|---|---|---|
| ක්ෂයවීම් සහ වෙනත් මෙහෙයුම් වියදම් | | 4,996,061 | | 4,330,877 | |
| වෙනත් වියදම් | | 22,907,344 | | 11,556,206 | |
| **මුළු වියදම්** | | | 87,260,061 | | 64,274,134 |
| | | | | | |
| මෙහෙයුම් කටයුතුවලින් අතිරික්තය/(හිඟය) | | | (1,985,332) | | (6,971,036) |
| | | | | | |
| **මූල්‍ය පිරිවැය** | | | | | |
| දේපල, යන්ත්‍ර සූත්‍ර සහ ආම්පන්න විකුණුම් මත ලැබීම් | | | - | | |
| මෙහෙයුම් නොවන මුළු ආදායම (වියදම්) | | | (1,985,332) | | (6,971,036) |
| අතිවිශේෂ කටයුතුවල අතිරික්තය/(හිඟය) | | | | | |
| අතිවිශේෂ කටයුතු | | | - | | - |
| කාල සීමාව සඳහා අතිරික්තය/(හිඟය) | | | - | | - |
| | | | (1,985,332)<br>========= | | (6,971,036)<br>======= |

මෙම මූල්‍ය වාර්තා සම්පාදනය කිරීමෙහි
සහ ඉදිරිපත් කිරීමෙහි ලා මෙම ආයතනයෙහි
කලමනාකරණ මණ්ඩලය වග කියනු ලබන අතර,
එම මණ්ඩලය සඳහා සහ වෙනුවෙන්
මෙම මූල්‍ය වාර්තාවලට අත්සන් තබා ඇත.

මෙම මූල්‍ය වාර්තා, 1978 අංක 16 දරන
විශ්වවිද්‍යාල පනත සහ ව්‍යවස්ථාපිත
විධිවිධාන හා අනුකූල වේ.

මහාචාර්ය පූජ්‍ය කොටපිටියේ රාහුල හිමි
අධ්‍යක්ෂ
පාලි හා බෞද්ධ අධ්‍යයන
පශ්චාත් උපාධි ආයතනය

කළමනාකරණ මණ්ඩල සාමාජික
පාලි හා බෞද්ධ අධ්‍යයන
පශ්චාත් උපාධි ආයතනය

ඒ.පී.එස්.එම්. දොලගේ මහත්මිය
ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී
පාලි හා බෞද්ධ අධ්‍යයන
පශ්චාත් උපාධි ආයතනය

**පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය**
**කැලණිය විශ්වවිද්‍යාලය**
**2016 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රවාහ වාර්තාව**

| | 2016 | | 2015 | |
|---|---|---|---|---|
| මෙහෙයුම් කටයුතුවලින් මුදල් ප්‍රවාහ | රු. | රු. | රු. | රු. |
| වර්ෂය සඳහා අතිරික්තය/(හිඟය) | | (1,985,332) | | (6,971,036) |
| | | | | |
| මුදල් ප්‍රවාහ ඇතුලත් නොවන කටයුතු සඳහා ගැලපීම් | | - | | - |
| පාරිතෝෂිත | | 1,954,814 | | 1,146,237 |
| ක්ෂයවීම් | | 4,660,944 | | 4,244,470 |
| වෙනත් මෙහෙයුම් වියදම් | | 333,102 | | 86,408 |
| වෙනත් මෙහෙයුම් ආදායම් | | (307,086) | | (1,134,633) |
| ක්‍රමක්ෂය | | (5,580,693) | | (4,244,471) |
| | | (924,251) | | (6,873,025) |
| පූර්ව කාලසීමා කටයුතු | | - | | - |
| කාරක ප්‍රාග්ධන කටයුතුවල වෙනස්වීම්වලට ප්‍රථම මෙහෙයුම් අතිරික්තය | | **(924,251)** | | **(6,873,025)** |
| | | | | |
| කාරක ප්‍රාග්ධන කටයුතුවල වෙනස්වීම් | | | | |
| ගබඩා අත්තිකාරම්හි හා පර්යේෂණ සහ ප්‍රකාශන තොගවල පහළ යාම/(ඉහළ යාම) පහළ යාම | (571,625) | | 23,371 | |
| සුළු ණයගැතියන්ගේ පහළ යාම/(ඉහළ යාම) | (187,918) | | (109,326) | |
| කාර්ය මණ්ඩල අත්තිකාරම්හි පහළ යාම/(ඉහළ යාම) | 805,037 | | 92,760 | |
| සේවා සහ සැපයුම් අත්තිකාරම්හි පහළ යාම/(ඉහළ යාම) | (2,498) | | 45,875 | |
| අත්තිකාරම් ගෙවීමෙහි පහළ යාම/(ඉහළ යාම) පහළ යාම | 23,249 | | 726,691 | |
| වෙනත් තැන්පතුවල පහළ යාම/(ඉහළ යාම) | - | | - | |
| ලැබිය හැකි ආයෝජන මත පොලියෙහි පහළ යාම/(ඉහළ යාම) | - | | - | |
| තැන්පතු සහ සුළු ණයහිමියන්ගේ | 489,525 | | 361,904 | |

| | | | | |
|---|---|---|---|---|
| ඉහළ යාම (පහළයාම) | | | | |
| උපචිත වියදම් සහ අනෙකුත් වගකීම්හි ඉහළ යාම (පහළයාම) | 7,439,750 | 7,995,519 | 336,994 | 1,478,269 |
| **මෙහෙයුම් කටයුතුවලින් ජනනය වූ දළ මුදල් ප්‍රමාණය** | | **7,071,268** | | **(5,394,756)** |
| | | | | |
| <u>ආයෝජන කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහ</u> | | | | |
| ස්ථාවර වත්කම් මිලදී ගැනීම | (2,284,057) | | (3,370,723) | |
| වෙනත් ආයෝජන | (1,013,432) | | (3,787,302) | |
| ආයෝජන කටයුතු සඳහා භාවිත කළ දළ මුදල් | | **(3,297,489)** | | **(7,158,025)** |
| | | | | |
| <u>මූල්‍ය කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහ</u> | | | | |
| ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ ප්‍රදාන | 6,400,000.00 | | 2,750,000 | |
| ත්‍යාග සහ පරිත්‍යාග | 2,893,426 | | 1,112,293 | |
| වෙනත් අරමුදල් | 6,272,077 | | 3,869,790 | |
| මූල්‍ය කටයුතුවලින් ජනනය වූ මුදල් | | 15,565,502 | | 7,732,082 |
| **මුදල් සහ මුදල් සමානයන්හි දළ ඉහළයාම** | | **19,339,281** | | **(4,820,698)** |
| වසර මුලදී මුදල් සහ මුදල් සමානයන්හි ශේෂය | | - 35 - 8,012,202 | | 12,832,901 |
| වසර අගදී මුදල් සහ මුදල් සමානයන්හි ශේෂය (සටහන 1) | | **27,351,484** ======== | | **8,012,202** ======= |
| | | | | |
| **<u>සටහන 1</u>** | | **<u>2016</u>** | | **<u>2015</u>** |
| | | රු. | | රු. |
| බැංකු ශේෂය | | 27,351,484 | | 8,012,202 |
| අනෙක් බැංකු ශේෂය | | - | | - |
| | | **27,351,484** ======== | | **8,012,202** ======= |

**පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය**
**කැලණිය විශ්වවිද්‍යාලය**
**2016 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා දළ වත්කම්/සම කොටස්හි වෙනස්කම් පිළිබඳ වාර්තාව**

| | ආයතනයෙහි සාමාන්‍ය සංචිතය<br>රු. | පිළිඇගයීම් ශේෂ ගිණුම<br>රු. | මුළු වටිනාකම<br>රු. |
|---|---|---|---|
| **2014-01-01 දිනට ශේෂය** | (7,267,547) | 798,276 | (6,469,270) |
| බැහැර කළ පරිත්‍යාග අයිතමයන්හි මාරු කළ අගය | 637,957 | - | 637,957 |
| 2014 වර්ෂය සඳහා අතිරික්තය/(හිඟය) | (781,671) | - | (781,671) |
| **2015-01-01 දිනට ශේෂය** | (7,411,260) | 798,276 | **(6,612,984)** |
| බැහැර කළ පරිත්‍යාග අයිතමයන්හි මාරු කළ අගය | - | - | - |
| | | | |
| 2015 වර්ෂය සඳහා අතිරික්තය/(හිඟය) | (6,971,036) | 1,048,095 | (5,922,941) |
| **2015-01-31 දිනට ශේෂය** | (14,382,297)<br>========= | 1,846,372<br>======= | **(12,535,925)**<br>**========** |
| | | | |
| **2016-01-01 දිනට ශේෂය** | (14,382,296) | 1,846,372 | (12,535,294) |
| කිම් ප්‍රදානයේ ශේෂය සංචිතය වෙත මාරු කිරීම | 4,529 | - | 4,529 |
| බෞද්ධ ආයුර්වේද ශේෂය සංචිතය වෙත මාරු කිරීම | 50,000 | - | 50,000 |
| ගබඩා අත්තිකාරම් ගිණුම සඳහා ගැලපුම් | 18,238 | - | 18,238 |
| 2016 වර්ෂය සඳහා අතිරික්තය/(හිඟය) | (1,985,332) | - | (1,985,332) |
| **2016-12-31 දිනට ශේෂය** | (16,294,861) | 1,846,372 | **(14,448,490)** |

<u>මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්</u>

**1. සාමාන්‍ය ප්‍රතිපත්ති**

**1.1. ප්‍රධාන කටයුතු සහ සකස් කිරීමේ ස්වභාවය**

මෙම ආයතනය විසින් පාලි හා බෞද්ධ අධ්‍යයනය සඳහා විශේෂඥතාවක් දක්වනු ලබන සිසුන් වෙත පශ්චාත් උපාධි උපදෙස්, පුහුණුව සහ පර්යේෂණ ලබා දෙන අතර, උපාධි සහ ඩිප්ලෝමා පිරිනමනු ලබයි.

**1.2. සකස් කිරීමේ පදනම**

මෙම මූල්‍ය වාර්තා, මූල්‍ය තත්ත්ව වාර්තා, මූල්‍ය කාර්යසාධන වාර්තාව, දළ වත්කම් සහ සමකොටස්හි වෙනස්කම් වාර්තාව, මූල්‍ය ප්‍රවාහ වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්වලින් සමන්විත වේ.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන් විසින් නිකුත් කරන ලදුව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සිය මූල්‍ය චක්‍රලේඛ ලිපි අංක 03/2011 මඟින් අදාල කර ගනු ලැබ ඇති, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්වලට අනුව, ආයතනයෙහි මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කරනු ලැබ ඇත.

**2. සුවිශේෂ ගිණුම්කරණ ප්‍රතිපත්ති**

**2.1. දේපල, යන්ත්‍රෝපකරණ සහ ආම්පන්න**

ලී බඩු සහ මෙවලම්, කාර්යාලයීය උපකරණ, ඉගැන්වීමේ උපකරණ, පුස්තකාල පොත් සහ කාලීන සඟරා, මෝටර් රථ සහ වෙනත් වත්කම් සහ රජයේ ප්‍රදාන මඟින් ලබාගෙන ඇති භාණ්ඩ, අභ්‍යන්තරිකව ජනනය වූ මුදල් සහ පරිත්‍යාග.

**(අ) හඳුනාගැනීමේ පදනම**

දේපල, යන්ත්‍රෝපකරණ සහ ආම්පන්න හඳුනාගත හැකි වනුයේ, මෙම අයිතම හා බැඳි අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනය වෙත ගලා යනු ලැබුවහොත් සහ එම අයිතමවල පිරිවැය හැකිතාක් දුරට ගණනය කරනු ලැබිය හැකි සම්භාවිතාවක් ඇත්නම් පමණි.

අවුරුදු 5 සිට 10 දක්වා පරාසයක් තුල දිවෙන ආර්ථික කාලසීමාවක් සහිත එක් එක් ප්‍රභේද 5ක් තුල, එම අදාළ ප්‍රභේදය මත වත්කමක ආයු කාලය රඳා පවතී.

**(ආ) ක්ෂයවීම්**

දේපල, යන්ත්‍රෝපකරණ සහ ආම්පන්න භාවිතය සඳහා යොදා ගනු ලබන දින සිට ඒවායේ ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ආයු කාලය අනුවසෘජු රේඛීය ක්‍රමවේදය මත, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය තුල ක්ෂයවීම් හඳුනා ගනු ලැබේ.

වත්කම්හි ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ආයු කාලය පහත සඳහන් පරිදි වේ :

| **වත්කම** | **ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ආයු කාලය** |
|---|---|
| ලී බඩු සහ මෙවලම් | අවුරුදු 10 |
| විද්‍යාගාර සහ ඉගැන්වීමේ උපකරණ | අවුරුදු 05 |
| කාර්යාලයීය උපකරණ | අවුරුදු 05 |
| පුස්තකාල පොත් සහ කාලීන සඟරා | අවුරුදු 05 |
| මෝටර් රථ | අවුරුදු 05 |

**(ඇ) කාර්යාල පරිශ්‍ර සහ එහි නඩත්තු කිරීම්**
දැනට මෙම ආයතනය කුලියට ගන්නා ලද ගොඩනැගිල්ලක පිහිටුවා ඇති අතර, රු.25,000/- නොඉක්මවන සුළු අලුත්වැඩියාකිරීම් සඳහා ගෙවීම් සිදු කිරීමට ආයතනය විසින් එකඟතාව පල කරනු ලැබ ඇත. ඇති වන පරිදි, නඩත්තු ගාස්තු ආදායම් හා වියදම් ගිණුමට ඇතුලත් කෙරෙනු ලැබේ.

**(ඇ) ස්ථාවර වත්කම් ලේඛනය**
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ස්ථාවර වත්කම් ලේඛනය අවසන් කරනු ලැබ ඇත. අවසන් ගිණුම් සමඟ ස්ථාවර වත්කම් සැසඳීම 2015-12-31 දිනට අවසන් කරන ලද අතර, විශේෂ කමිටුව විසින් මෙම කාර්යය නිරීක්ෂණය කර, වාර්තාවක් නිකුත් කරන ලදී. 2017-02-27 දින පැවැති 47වන විගණන කමිටුව වෙත කමිටු වාර්තාව ඉදිරිපත් කරන ලද අතර, විගණන කමිටු උපදෙස් මත අවශ්‍ය පියවර ගනු ලැබේ.

## 3. ජංගම වත්කම්

ශේෂ පත්‍රයෙහි ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලැබ ඇත්තේ, මූල්‍ය ප්‍රකාශන දිනයේ සිට එක් වසරක් තුල නැවත අය කර ගනු ලැබිය හැකි වත්කම්ය.

### 3.1. භාණ්ඩ ලේඛන සහ තොග

(අ) භාණ්ඩ ලේඛනයන්හි පිරිවැය, first-in-first-out පදනම මත නිර්ණය කරනු ලැබ ඇති අතර, ඒවා අත්පත් කරගැනීමේදී සහ පෙර පැවැති තත්ත්වයට හා ස්ථානයට ගෙන ඒම පිණිස දැරීමට සිදු වන පිරිවැය ඇතුලත් වේ.

(ආ) දිගු කාලයක් පුරා ගබඩා අත්තිකාරම් ගිණුමේ සහ තොග ශේෂයන් අතර වෙනසක් පැවැති අතර, 2016 වර්ෂයේදී, එය සසඳා, විගණන හා කළමනාකරණ කමිටු අනුමැතිය සහ කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය සහිතව, වැරදි නිවැරදි කිරීමේ ජර්නල් සටහන් යවා ඇත.

**4. ජංගම වගකීම්**

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කරනු ලැබ ඇති වගකීම් වනුයේ, මූල්‍ය ප්‍රකාශන දිනයේ සිට එක් වසරක් තුල ගෙවනු ලැබිය යුතු වගකීම්ය. මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී, දත් සියලුම වගකීම් ගණනය කරනු ලැබ ඇත.

**5. පාරිතෝෂිත සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම්**

සියලුම සේවකයින් එම වසර තුලදීම විශ්‍රාම ගනු ලබන්නේ නම් ගෙවනු ලැබිය හැකි මුදල් ප්‍රමාණය පිළිබඳව පූර්ව නිගමනය කරමින්, 1983 අංක 12 දරන පාරිතෝෂිත පනත යටතේ විශ්‍රාම ගනු ලබන පුද්ගලයින් වෙත ගෙවනු ලැබිය හැකි පාරිතෝෂිත සඳහා මූල්‍ය ප්‍රකාශන තුල ප්‍රතිපාදන වෙන්කිරීම් සිදු කරනු ලැබ ඇත.

**6. පොලී ආදායම**

කාලසීමාව සඳහා ලද සහ ලැබීමට නියමිත පොලී ආදායම, බාහිරව සීමා කරනු ලැබූ පරිත්‍යාග මත උපයන ලද ආයෝජන ආදායම් හැර, ලද ආදායම් ලෙස මූල්‍ය ප්‍රකාශන තුල වාර්තා කෙරෙනු ලැබේ. එවැනි අරමුදල් මත හිඟ පොලී ආදායම්, එම වර්ෂය තුල ඍජු අරමුදල් ඉහළ යාමක් ලෙස වාර්තා කෙරෙනු ලැබේ.

**7. වියදම් හඳුනාගැනීම**

අධ්‍යාපන සහ පර්යේෂණ හා සම්බන්ධ සියලුම වියදම්, උපචිත වියදම් ලෙස වාර්තා කෙරෙනු ලබන අතර, ස්ථිර ස්වභාවයේ වත්කම් අත්පත් කරගැනීමේදී හෝ වැඩිදියුණුකිරීමේදී පැන නැඟිනු ලබන සියලුම වියදම්, ප්‍රාග්ධන වියදම් ලෙස සලකනු ලැබේ.

**8. විදේශ විනිමය**

තැන්පතු සිදු කරනු ලබන දිනයේදී පවතින විනිමය අනුපාතයට අනුව විදේශ විනිමය තුල සිදු කෙරෙනු ලබන ගණුදෙණු වාර්තාගත කෙරෙනු ලැබේ.

**9. අදාළ අනුමැතීන් ද සහිතව, අතිරේක වැය ශීර්ෂවල සිට හිඟ වැය ශීර්ෂ වෙත වියදම් මාරු කිරීමේදී, අවස්ථා කිහිපයකදී පහත සඳහන් අයවැය මාරු කිරීම් සිදු කරනු ලැබ ඇත:**

I. ගමන් ප්‍රදානවලින් (6.01) විශ්වවිද්‍යාල ආචාර්යවරුන් වෙත රු.300,000/-ක් සහ උපාධි ප්‍රදානෝත්සවවලින් (6.13) ගමන් වියදම් (විදේශ) වෙත රු.500,000/-ක් මාරු කිරීම - 2.02;

II. කුලී හා බදු ගාස්තුවලින් (5.08) වරිපනම් හා දේශීය බදු (5.09) වෙත රු.25,000/-ක් මාරු කිරීම;

III. ලිපිද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතාවලින් (3.01) විශේෂ සේවා, වෘත්තීය හා වෙනත් ගාස්තු (6.03) වෙත රු.600,000/-ක් මාරු කිරීම;

IV. ඉන්ධන හා ලිහිසි තෙල්වලින් (3.02) විශේෂ සේවා, වෘත්තීය හා වෙනත් ගාස්තු (6.03) වෙත රු.400,000/-ක් මාරු කිරීම;

V. සුළු අලුත්වැඩියාකිරීම්, නඩත්තු හා වෙනත් (04.05) වලින් විශේෂ සේවා, වෘත්තීය හා වෙනත් ගාස්තු (6.03) වෙත රු.400,000/-ක් මාරු කිරීම;

VI. පර්යේෂණ ශක්තිමත් කිරීම්වලින් (102) අධ්‍යයන පර්යේෂණ හා ප්‍රකාශන (6.05) වෙත රු.380,000/-ක් මාරු කිරීම;

VII. පර්යේෂණ ශක්තිමත් කිරීම්වලින් (102) ශිෂ්‍ය සුබසාධනය, සේවක සුබසාධනය, ශිෂ්‍ය සභා සහ සමාජ සංහිඳියාව (6.17) වෙත රු.254,659/-ක් මාරු කිරීම;

VIII. ශිෂ්‍යයින් සඳහා පාඨමාලා ආධාරක හා ගුණාත්මකබව වැඩිදියුණුකිරීම්වලින් (6.16) ශිෂ්‍ය සුබසාධනය, සේවක සුබසාධනය, ශිෂ්‍ය සභා සහ සමාජ සංහිඳියාව (6.17) වෙත රු.200,000/-ක් මාරු කිරීම.

## 10. මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය ඍජු නොවන ක්‍රමවේදය භාවිත කරමින් සකස් කරනු ලැබ ඇත.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
**AUDITOR GENERAL'S DEPARTMENT**

මගේ අංකය / எனது இல. / My No. එච්ඊ/ඊ/පීඅයිපීබීඑස්/1/16/05 ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2017 ජූනි 06 දින

අධ්‍යක්ෂ,

පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය.

**කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 (1) උපවගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

යථෝක්ත වාර්තාව මේ සමග එවා ඇත.

එච්.එම්.ගාමිණී විජේසිංහ

විගණකාධිපති

පිටපත් -

1. ලේකම් , උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය
2. ලේකම් , මුදල් අමාත්‍යාංශය
3. උපකුලපති , කැළණිය විශ්වවිද්‍යාලය
4. සභාපති , විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka

+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } එච්ඊඩී/ඊ/පීඅපීපීඅ/1/16/05 ඔබේ අංකය / உமது இல. / Your No. }   දිනය / திகதி / Date } 2017 ජුනි [illegible] දින

අධ්‍යක්ෂ,

පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය.

**කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 (1) උපවගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වගන්තිය ප්‍රකාරව පනවා ඇති 1979 අංක 08 දරන පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතන නියමාවලියේ 23 වගන්තිය, විශ්වවිද්‍යාල පනතේ 107 (5) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවියයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. විශ්වවිද්‍යාල පනතේ 108(1) උපවගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. විශ්වවිද්‍යාල පනතේ 108(2) උප වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ අධ්‍යක්ෂවරයා වෙත 2017 අප්‍රේල් 20 දින නිකුත් කරන ලදි.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ද කළමනාකරණයේ වගකීම වේ.

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94 11 2887028-34   +94 11 2887223   oaggov@sltnet.lk   www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 111 වැනි වගන්තිය ප්‍රකාර විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවැරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

ආයතනය විසින් ප්‍රදාන, ක්‍රමක්ෂය කිරීම සඳහා ගිණුම ප්‍රතිපත්තියක් හඳුනාගෙන නොතිබුණු අතර පසුගිය වර්ෂ කිහිපයකදී ආයතනයට ප්‍රදාන ලෙස ලැබී තිබුණු වටිනාකම රු.284,016 ක් වූ පොත්පත් භාණ්ඩ හා උපකරණ වත්කම් ලෙස ගිණුම්ගතකර ක්ෂය කර තිබුණද ඒ වෙනුවෙන් වූ අරමුදල් ක්‍රමක්ෂය කිරීමට කටයුතු කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව තොග වටිනාකම රු.534,370 ක් වූ අතර එදිනට ගබඩා තොග සමීක්ෂණ වාර්තා අනුව තොග ශේෂය රු.420,520 ක් වූයෙන් වර්ෂය අවසානයේ තොග ඌනතා හා අතිරික්තතා හඳුනාගෙන ගිණුම්ගතකර නොතිබුණි.

(ආ) 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන පර්යේෂණ හා ප්‍රකාශන තොග වටිනාකම හා භෞතික තොග වටිනාකම අතර රු.113,272 ක ඌනතාවයක් නිරීක්ෂණය විය. මෙම වෙනසට හේතුන් හඳුනාගෙන අයවිය යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට හෝ පාඩුවක් ලෙස ලියාහැරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2016 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ස්ථාවර තැන්පතු මත පොලිය රු.60,062 ක් ගණනය කර ගිණුම්ගත නොකිරීම හේතුවෙන් ස්ථාවර තැන්පතුවල වටිනාකම හා පොලී ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි.

### 2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය විසින් පවත්වාගෙන යනු ලබන ස්ථාවර වත්කම් ලේඛනයට අනුව මුළු වත්කම්වල වටිනාකම රු.36,040,387 ක් වූ අතර මූල්‍ය ප්‍රකාශනවලට අනුව එම වටිනාකම රු.39,700,003 ක් වූයෙන් මුළු ස්ථාවර වත්කම්වල රු.3,659,616 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) මූල්‍ය ප්‍රකාශන අනුව 2016 වර්ෂයේ දී මිලදී ගත් පොත් සහ වාර සඟරා වටිනාකම රු.1,118,489 ක් වුවත් පුස්තකාලය විසින් ලබා දුන් තොරතුරු අනුව එය රු.1,265,973 ක් විය. ඒ අනුව රු.147,484 ක වෙනසක් නිරීක්ෂණය විය.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ ඌනතාවය රු.1,985,332 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.6,971,036 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු.4,985,704 කින් අඩු වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ වියදම රු.22,997,327 කින් වැඩිවී තිබුණද රජයේ ප්‍රදාන රු.11,400,000 කින් හා වෙනත් ආදායම රු.5,771,331 කින් වැඩි වීම ඉහත ඌනතාවය අඩුවීම කෙරේ ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

ඉකුත් වර්ෂ 05 ක මෙහෙයුම් ප්‍රතිඵලය සලකා බැලීමේදී අඛණ්ඩ ඌනතාවයක් පැවතියද සේවක පාරිශ්‍රමික හා අනෙකුත් ගැලපීම් කිරීමෙන් පසු එකතු කළ අගය වර්ධනය වීමේ ප්‍රවනතාවයක් නිරීක්ෂණය වේ. 2015 වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂයේ දී රජයේ ප්‍රදාන මිලියන 11 කින් වැඩි වීම හේතු කොට ගෙන ඌනතාවය සියයට 71 කින් අඩු වී තිබුණද එයට සාපේක්ෂව එකතු කළ අගය සියයට 51 කින් වර්ධනය වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

ශිෂ්‍යයන් ඇතුළත් කර පාලි බෞද්ධ විෂය ක්ෂේත්‍රය පිළිබඳ පශ්චාත් උපාධි තත්ත්වයේ ඉගැන්වීම, පුහුණු වීම හා පර්යේෂණ කිරීම සඳහා කටයුතු සැලැස්වීම පශ්චාත් උපාධි, අභිඥාන පත්‍ර, සහතික පත්‍ර හා වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා නිශ්චය කිරීම හා ප්‍රදානය කිරීමට සුදුසුකම් ලැබූ තැනැත්තන් විශ්වවිද්‍යාලයට නිර්දේශ කිරීම සහ තනතුරු ඇති කිරීම හෝ අත්හිටුවීම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලයට නිර්දේශ කිරීම ආයතනයේ ප්‍රධාන අරමුණු විය.

ආයතනයේ මෙම අරමුණු ඉටුවීම සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) <u>අධ්‍යයන කාර්යසාධනය</u>

ආයතනයේ 2016 වර්ෂයේ උපාධි පාඨමාලා සඳහා ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව 527 ක් වූ අතර එයින් 464 ක් විභාග සඳහා පෙනී සිට තිබුණි. පසුගිය වර්ෂයේ සිසුන් 443 ක් ලියාපදිංචි වී සිටි අතර 390 ක් විභාග සඳහා පෙනී සිට තිබුණි. පසුගිය වර්ෂයේ විභාග සමත් ශිෂ්‍ය සංඛ්‍යාව 314 හෙවත් සියයට 80 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ විභාග සමත් ශිෂ්‍ය සංඛ්‍යාව 419 ක් හෙවත් සියයට 79 ක් විය.

(ආ) <u>පර්යේෂණ ආධාර</u>

විශ්වවිද්‍යාලයේ ආචාර්යවරුන් විසින් සිදු කරනු ලබන පර්යේෂණ ප්‍රකාශයට පත් කිරීම මගින් විශ්වවිද්‍යාලය ඉහළ මට්ටමකට හා ගුණාත්මක තත්ත්වයට ගෙන ඒමත් එම පර්යේෂණ නිබන්ධන ආර්ථික සංවර්ධනය උදෙසා ඉවහල් කර ගැනීමත් ජාතියක් වශයෙන් වැදගත්වනු ඇත.

ඒ සඳහා පර්යේෂණ ආධාර වශයෙන් සමාලෝචිත වර්ෂයේදී භාණ්ඩාගාරයෙන් රු.1,000,000 ක් ලබාදී තිබුණි. පර්යේෂණ දීමනා ලබන නිලධාරීන් දස දෙනෙකු ආයතනයේ සිටියදී එක් ආචාර්යවරයෙකුට පමණක් ඇස්තමේන්තුගත පිරිවැය රු.380,000 ක් වූ පර්යේෂණ ව්‍යාපෘතියක් ආරම්භ කිරීම සඳහා 2016 වර්ෂය තුළදී රු.200,000 ක් ගෙවා තිබුණි. මේ අනුව පර්යේෂණ ව්‍යාපෘති සඳහා ලැබී තිබුණු මුදලින් ප්‍රයෝජනය කර තිබුණේ සියයට 20 ක් බැවින් පර්යේෂණ සඳහා යොමුවීමේ අඩුවීමක් විගණනයේදී නිරීක්ෂණය විය.

(ඇ) <u>ප්‍රාග්ධන ආධාර</u>

අධ්‍යයන ක්ෂේත්‍රවල උසස් අධ්‍යාපනය ලබා දීම, දියුණු කිරීමේ හා සංවර්ධනය කිරීමේ කාර්යය සඳහා විශ්වවිද්‍යාල පිහිටුවා ඇති අතර එහි කටයුතු ඵලදායිව හා කාර්යක්ෂමව ඉටු කිරීම උදෙසා රජය මගින් ප්‍රතිපාදන ලබා දී තිබුණි. එහෙත් ඉකුත් වර්ෂවල ලැබුණු ප්‍රාග්ධන ප්‍රදානවලින් වර්ෂය ආරම්භය වන විට රු. 502,938 ක් උපයෝජනය කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂයේදී ලද රු. 6,202,115 කින් වැය කර තිබුණේ රු.2,920,832 ක් පමණක් වූ අතර එය මුළු ප්‍රතිපාදනයෙන් 48 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසානයට වැය නොකළ ප්‍රාග්ධන ප්‍රදාන ශේෂය රු. 3,784,221 ක් විය. මෙම ප්‍රදාන මුදල කාර්යාල, ඉගැන්වීම් උපකරණ හා පුස්තකාල පොත් අත්පත් කර ගැනීම සඳහා ලබා දී තිබුණු නමුත් එම මුදල් ඒ සඳහා නොයෙදවීම ආයතනයේ කාර්යසාධනය කෙරෙහි බලපාන බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඈ) <u>උපයන ලද ආදායම් උපයෝජනය කිරීම</u>

පශ්චාත් උපාධි ආයතනය විසින් උපයන ලද මුළු ආදායමෙන් ආයුර්වේද පාඨමාලාව සඳහා වෙන්කරන ලද මුදලින් රු.137,452 ක් පසුගිය වර්ෂ 04 තුලම උපයෝජනය කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේදී ද රු.67,000 ක් වෙන්කර තිබුණු අතර වර්ෂය අවසානයට එහි රු.204,452 ක ශේෂයක් පැවතුණි. එසේම 2015 හා 2016 වර්ෂයන්හි දිගුකාලීන පාඨමාලා සඳහා එකතු කළ රු.3,488,586 ක ආදායමින් වැයකළ ප්‍රමාණය රු.878,624 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට එහි රු.2,609,962 ක ශේෂයක් ඉතිරි වී පැවතුණි. මෙම මුදල් ආයතනයේ සංවර්ධන කටයුතු සඳහා යොදා ගැනීම කෙරෙහි අවධානය යොමු කර නොමැති බව නිරීක්ෂණය විය.

(ඉ) <u>පුස්තකාල පරිපාලනය</u>

පුස්තකාල පරිග්‍රහණ ලේඛනයේ ඇතුළත් කර ඇති නමුත් අස්ථානගත වී ඇති පොත් 693 කින් වටිනාකම රු.30,725 ක් වූ පොත් 156 ක් 1977 වසරේ සිට 2012 වසර දක්වා කාලයට අයත් බව නිරීක්ෂණය විය.

(ඊ) මෙම ආයතනය ආරම්භයේ සිට වසර 38 ක කාලයක් කුලී ගොඩනැගිල්ලක පවත්වාගෙන ගොස් තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී ගොඩනැගිලි කුලී වශයෙන් මාසයකට රු.764,583 ක් බැගින් සමාලෝචිත වර්ෂයට රු.9,174,996 ක් ගෙවා තිබුණි. ආයතනය සඳහා ඉඩමක් මිලදී ගෙන ගොඩනැගිල්ලක් ඉදිකිරීම ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රධාන කාර්යක් ලෙස දක්වා ඒ සඳහා රු.500,000,000 ක් ද වෙන් කර තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂයේ භාණ්ඩාගාරයෙන් ඒ සඳහා ප්‍රතිපාදන ලබා දී නොතිබුණු අතර විගණිත දිනය වූ 2017 මාර්තු 31 දක්වා ද මෙම කාර්යය ඉටුකරගෙන නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වූ බැංකු සැසඳුම් පරීක්ෂා කිරීමේදී මාස 06 ක කාලයක් ඉක්මවූ රු.109,389 ක හඳුනානොගත් ආදායම් නිරීක්ෂණය විය.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 5.1 ක්‍රියාකාරී සැලැස්ම

ආයතනය විසින් 2016 වර්ෂයේ දී ශිෂ්‍ය කාර්යසාධනය යටතේ ළඟා කර ගැනීමට අපේක්ෂිත කාර්යයන් 16 ක් දක්වා තිබුණු අතර එයින් කාර්යයන් 04 ඉටු කර නොතිබුණි.

එසේම නව පාඨමාලා දෙකක් හඳුන්වා දීමට සැලසුම් කර තිබුණද 2016 වර්ෂයේ දී ආයතනය විසින් නව පාඨමාලා කිසිවක් හඳුන්වා දී නොතිබුණි.

### 5.2 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂයේ පුරෝකථනය කළ ආදායම හා සත්‍ය ආදායම සලකා බැලීමේදී ආදායම් රු.14,967,643 කින් වැඩි වී තිබූ අතර ඒ සඳහා දේශන ගාස්තු හා පාඨමාලා ආදායම් වැඩි වීම බලපා තිබුණි. එසේම 2016 හා 2015 වර්ෂවල අයවැය ගත වියදම හා සත්‍ය වියදම් පරීක්ෂාවේදී මෙහෙයුම් වියදම් වැඩියෙන් පුරෝකථනය කර තිබුණු බව නිරීක්ෂණය වුයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගි කරගෙන නොතිබුණි.

6. පද්ධති හා පාලනයන්

---

විගණනයේදි නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමුකරවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| <u>පද්ධති හා පාලන ක්ෂේත්‍ර</u> | | <u>නිරීක්ෂණ</u> |
|---|---|---|
| (අ) ගබඩා පාලනය | - | තොග ඌනතා හා අතිරික්තතා ගලපා ගිණුම් නිවැරදි කර නොතිබීම. |
| (ආ) අයවැය පාලනය | - | අවශ්‍යතාවය ඉක්මවා වියදම් පුරෝකථනය කිරීම. |
| (ඇ) පුස්තකාල පාලනය | - | පුස්තකාල පොත් ආපසු භාර දීම, පොත් සමීක්ෂණය, පොත් ලේඛනගත කිරීම, පොත් අස්ථානගත වීම. |

එච්.එම්. ගාමිණී විජේසිංහ

විගණකාධිපති

පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය
කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව
POSTGRADUATE INSTITUTE OF PALI AND BUDDHIST STUDIES
UNIVERSITY OF KELANIYA - SRI LANKA

No. 113, Dutugemunu Street, Kohuwala.
අංක 113, දුටුගැමුණු වීදිය, කොහුවල.

මගේ අංකය :
My No : PIPBS/ST/03/2017-02

ඔබේ අංකය :
Your No :

2017.07.06

<u>ලියාපදිංචි තැපැල</u>

විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
අංක 306/72, පොල්දූව පාර,
බත්තරමුල්ල.

ප්‍රිය මහත්මයාණෙනි,

**<u>කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(1) උප වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබගේ අංක එච්ඊඩී/ඊ/පීඅයිපීබීඑස්/1/16/05 හා 2017.06.06 වැනි දිනැති ලිපියට අනුව පහත සඳහන් පිළිතුරු විගණන කමිටු ආවරණ අනුමැතියට යටත්ව 2017.07.06 දින පැවති කළමනාකාර මණ්ඩලය විගණකාධිපතිතුමා වෙත යැවීමට අනුමත කරන ලද බව දන්වා සිටිමි.

2.2 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>

2.2.1 <u>ගිණුම්කරණ ප්‍රතිපත්ති</u>

2017 වර්ෂයේ දී නිවැරදි කිරීමට උපදෙස් දෙන ලදී.

2.2.2 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

(අ) 2005 වසරේ සිට පැවති ගබඩා තොග හා මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය අතර වෙනස හඳුනා ගැනීමෙන් අනතුරුව 2016 වර්ෂයේදී අදාළ ගැලපීම් කිරීම සඳහා අනුමැතිය ලබාගෙන ඇත. මෙ සඳහා වාර්තාවක් 2016.11.10 දින පැවති 45 වන විගණන කමිටු වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව අවසන් ගිණුම්හි ගැලපීම සඳහා අනුමැතිය ලැබී ඇත. එහිදී 2016 අවසන් ගිණුම් සකස් කිරී මෙදී වෙනසට හේතු වූ එක් සටහනක් ගැලපීමට නොහැකිවීම හා ලියා හල යුතු රු.42,000 ක ශේෂය සඳහා ගැලපීම් කිරීමට නොහැකි විය. 2017 වර්ෂයේ දී අදාළ සටහන් සම්පූර්ණ කිරීමට උපදෙස් දෙන ලදී.

(ආ) මේ සඳහා මේ වන විට අවශ්‍ය ලේඛන සකස් කරමින් පවතී. 2017 වර්ෂයේදී අවශ්‍ය ගැලපීම් කිරීමට අදාළ අංශයන් දැනුවත් කර ඇත.

අධ්‍යක්ෂ
Director
011 3132323
E-mail : pgipbs@sltnet.lk

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
Senior Assistant Registar
011 2809322
සාමාන්‍ය/General 011 2809321

ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී
Senior Assistant Bursar
011 5839851
ෆැක්ස්/Fax 011 2809322

(ඇ) මා විසින් සඳහන් කර ඇති ස්ථාවර තැන්පතු සඳහා ශේෂ සනාථ කිරීමේ දැන්වීම (Renewal Notice) අවසන් ගිණුම් සකස්කරන අවස්ථාව වන විටත් අදාළ මූල්‍ය ආයතන වෙතින් ලැබී නොතිබුණි. එහි පිටපතක් එම ආයතන වෙතින් ලිඛිතව ඉල්ලුම් කළ අතර එහෙත් 2016.12.31 දිනට ශේෂ සනාථ ලිපියෙහි වටිනාකම සඳහා අවසන් ගිණුම් සටහන් තබා ඇත.
2017 වර්ෂයේදී නිවැරදිව ආයෝජන ගිණුම් තැබීමට තැබීමට කටයුතු කරන ලෙස අදාළ පාර්ශ්වයන් දැනුවත් කරන ලදී.

2.2.3 <u>පැහැදිලි නොකළ වෙනස්කම</u>

(අ)

1. ස්ථාවර වත්කම ලේඛනය හා මූල්‍ය ප්‍රකාශන අතර 2015.12.31 දිනට පැවති වෙනස සඳහා අනාවරණය කරගන්නා ලද හේතු 2016 අගෝස්තු 25 දින පැවති 44 වන විගණන කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී.
2. 2015 වර්ෂයේ සිට පෙර වසර 07ක් පමණ වෙනසට හේතු අනාවරණය කරගෙන ඇත.ඒ අනුව ඉදිරිපත් කර තිබූ කරුණු සලකා බැලූ 44 වන විගණන කමිටුව, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හා විශ්වවිද්‍යාලය ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අභ්‍යන්තර විගණන අංශ සාමාජිකයින්ගෙන් සමන්විත කමිටුවක් පත් කර මෙ සම්බන්ධයෙන් තීරණයක් ගැනීමට උපදෙස් දෙන ලදී. .( 44 වන විගණන කමිටු තීරණය අමුණා ඇත) - ඇමුණුම් අංක 01
3. ඒ අනුව 2016.02.13 දිනැතිව ලද විශ්වවිද්‍යාලය ප්‍රතිපාදන කොමිෂන් සභාවෙහි ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණකගේ සභාපතීත්වයෙන් සමන්විත වූ කමිටු වාර්තාව 2017.02.27 දින පැවති ආයතනයේ විගණන කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී.( අදාළ වාර්තාවෙහි පිටපතක් අමුණා ඇත) - ඇමුණුම් අංක 01
4. වාර්තාවෙහි අන්තර්ගත කරුණු රජයේ විගණන අංශයෙන් පරීක්ෂා කර බලා ගතයුතු ඉදිරි ක්‍රියා මාර්ග තීරණය කිරීමට 47 වන විගණන කමිටුව උපදෙස් ලද අතර ඒ අනුව 2017 වර්ෂයේදී ඉහත වෙනස සඳහා අවශ්‍ය පියවර බව රජයේ විගණන අංශය අප වෙත දැනුම් දී ඇත.

කමිටු වාර්තාව හා 47 වන විගණන කමිටු තීරණය මෙ සමඟ අමුණා ඇත. - ඇමුණුම් අංක 01

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 <u>කාර්යසාධනය</u>

(අ) <u>අධ්‍යයන කාර්ය සාධනය</u>

ආයතනයේ අපේක්ෂිත අනුපාතයට ශිෂ්‍ය සංඛ්‍යාවේ වර්ධනයක් සිදු වී ඇති අතර විභාග සමත් ප්‍රතිශතයද ආයතනයේ අපේක්ෂිත අනුපාතය පෙන්නුම් කර තිබුණි.

(ආ) <u>පර්යේෂණ ආධාර</u>

මෙම පර්යේෂණ ආධාර දීමනා ප්‍රගතිය 2016.12.31 දිනට අදාළව ඉදිරිපත් කර ඇත. මෙය එක් වර්ෂයක පර්යේෂණ ව්‍යාපෘතියක් බැවින් 2017 ජුනි මස එය සම්පූර්ණ වීමට නියමිතය.

(ඇ) ප්‍රාග්ධන ආධාර

2016.12.31 දිනට වැය නොකළ ප්‍රාග්ධන මුදල රු.3,784,220/- කි. මින් රු.1,800,000/-ක මුදල් ආයතනය වෙත 2016.12.20 දින ප්‍රේෂණය කර ඇත. මෙම මුදල් 2017 වර්ෂයේ පළමු කාර්තුවේ දී අදාළ කාර්යන්හි පහත පරිදි යොදවා ඇත.
(1. කාර්යාලීය උපකරණ - රු.2,284,444.65/-, 2. පුස්තකාල පොත් 254,547.10/-)

- කෙටිකාලීන ආයෝජනය සදහා යොදවා ඇත්තේ මහා භාණ්ඩාගාර ප්‍රේෂණ නොවන අතර නිඹිරිගස්යාය ජංගම ගිණුමෙහි ඇති ආයතනය විසින් ශිෂ්‍යයන්ගෙන් අයකරන මුදල් වේ. මෙම මුදල් වසර පුරාවටම ආයතනයේ පුනරාවර්තන වියදම් දැරීමට යොදා ගනී. ජංගම ගිණුම මගින් පොලී මුදල් නොලැබෙන හෙයින් මෙසේ ආයෝජනය කිරීම තවදුරටත් වෙනත් ආදායම් ඉපයීමක් බව සඳහන් කරමි. තවද මෙය 2015 වර්ෂයේදී විශ්වවිද්‍යාලය ප්‍රතිපාදන කොමිෂන් සභාවේ විගණන උපදෙස් මත සිදු කරන ලද්දකි.

(ඈ) <u>උපයන ලද ආදායම් උපයෝජනය කිරීම</u>

ආයුර්වේද පාඨමාලාවෙහි මුදල් 2017 වර්ෂයේදී අවශ්‍යතාවය පරිදි යොදවා ගැනීමට අදාළ අංශ දැනුවත් කර ඇත.

මෙම පාඨමාලා (විදේශ) මුදල් වසරේ අවසාන මාස කිහිපය තුළදී ලැබෙන හෙයින් අදාළ වර්ෂයේ වියදම් කිරීමට අපහසුය. මින් රු. 1475000/-ක මුදලක් 2017 පළමු කාර්තුව තුළදී වියදම් කර ඇත. ඉතිරිය ඉදිරියේදී අවශ්‍යතාව පරිදි යොදවා ගැනීමට උපදෙස් දෙන ලදී.

(ඉ) මීට අදාළ නිරීක්ෂණ පහත සඳහන් පරිදි සංශෝධනය විය යුතුය.
පුස්තකාල පරිග්‍රහණ ලේඛනයේ ඇතුළත් කර ඇති නමුත් අස්ථානගත වී ඇති පොත් (1977 සිට 2016 දින තෙක්) සංඛ්‍යාව 671කි. ඊට අමතරව ශිෂ්‍යයින් විසින් බැහැර ගෙන ගොස් භාර නොදුන් පොත් සංඛ්‍යාව 154කි. එය 1977 සිට 2012 කාල පරිච්ඡේදයට අදාළ වන අතර ඒවායේ වටිනාකම රු.31,181.75කි

(ඊ) 2016 වර්ෂය තුළදී ඉඩමක් මිලදී ගැනීමට උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හා සම්බන්ධ වී පුවත්පත් මගින් මිල කැඳවා සුදුසු ඉඩමක් හඳුනා ගත් නමුදු ඉඩම් හිමිකරු රජයේ කත්සේරු මුදලට ඉඩම ලබාදීමට අකමැති විය. මෙ වනවිට අමාත්‍යාංශය මැදිහත්වීම මත කැලණිය විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨය සඳහා ලබා දෙන ඉඩමෙන් අක්කර 02ක් මෙම ආයතනය වෙත ලබාදීමට කටයුතු කරමින් පවතී.

(උ) මින් රු.31,911/-ක මුදල රිසිට්පතක් දෙවරක් නිකුත් කිරීමෙන් සිදුවූවක් වන අතර ඉතිරි මුදල් විවිධ අවස්ථාවන්හිදී ගිණුමට බැර වූ නමුත් අදාළ ආදායම් ශීර්ෂය හඳුනා ගත නොහැකි වූ ගනුදෙනු කිහිපයක එකතුවකි. ඉදිරියේදී මෙ පිළිබඳව සොයා බලා නිවැරදි කිරීමට අදාළ නිලධාරීන් දැනුවත් කර ඇත.

## 5. <u>ගිණුම් කටයුතුභාවය හා යහ පාලනය</u>

### 5.1 <u>ක්‍රියාකාරී සැලැස්ම</u>

2016 වර්ෂයේ කරන ලද සැලසුම්වලට අනුව විදේශීය අනුබද්ධ ආයතන වෙත පාඨමාලා හඳුන්වා දී ඇති අතර දේශීයව පාලි ඩිප්ලෝමා සහතික පත්‍ර පාඨමාලාවක් හඳුන්වා දී ඇත. ඊට අමතරව බුද්ධසමය හා නීති දර්ශනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව සම්බන්ධ නිර්දේශ සකස් කර ඇත. එමෙන්ම පාඨමාලාවන්හි කාලීන අවශ්‍යතා මත 2018 වර්ෂය සඳහා නිර්ණායක සංශෝධනය කර ඇත.

5.2 <u>අයවැය ලේඛනමය පාලනය</u>

ආදායම වැඩිවීම සඳහා විශේෂයෙන් විදේශයන්හි පවත්වා ගෙන යන පාඨමාලා සඳහා සිසුන් වැඩි වශයෙන් ලියාපදිංචිවීම හේතු වූණි.

උදා: සිංගප්පූරු පාඨමාලාව / හොංකොං පාඨමාලාව

අයවැය පාලනය පෙර වසරට සාපේක්ෂව උපරිම අයුරින් සිදු කළ බව අපගේ මතය වේ. මෙහෙයුම් වියදම් වැඩි වශයෙන් පුරෝකථනය කර තිබෙනුයේ විශේෂයෙන් ශිෂ්‍යයන් සම්බන්ධ කටයුතු සඳහාය. ආදායම් උපයන ආයතනයක් වශයෙන් ඉදිරියට යාමේදී මේ කටයුතු සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමු කළ යුතු බව මාගේ මතය වේ. කෙසේ වෙතත් 2017 වසරෙහි දී මෙම තත්වය තවදුරටත් සුභාවාදීව පාලනය කිරීමට අවශ්‍ය පියවර ගැනීමට සටහන් තබා ගනිමි.

6. <u>පද්ධති හා පාලනයන්</u>

(අ) ගබඩා පාලනය

2017 වසරේදී අවශ්‍ය නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග අවසන් කර ගත හැකි බව මාගේ මතය වේ.

(ආ) අයවැය පාලනය

2017 වර්ෂයේ සිට ඉදිරියට හැකිතාක් ප්‍රශස්ථ අන්දමින් භාවිතා කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දෙමි.

(ඇ) පුස්තකාල පාලනය

පෙන්වා දුන් කරුණු අවධානයට ගෙන අදාළ නිවැරදි කිරීම කර කටයුතු කිරීමට උපදෙස් දෙන ලදී.

ඉහත වාර්තාවේ සඳහන් කරුණු සම්බන්ධයෙන් සපයා ඇති පැහැදිලි කිරීම පිළිබඳව මම පෞද්ගලිකව ම වගවන බව මෙයින් සහතික කරමි.

මෙයට,

අධ්‍යක්ෂ
පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය
(කැලණිය විශ්වවිද්‍යාලය)
113, දුටුගැමුණු වීදිය,
කොහුවල.

මහාචාර්ය කොටපිටියේ රාහුල හිමි,
අධ්‍යක්ෂ

පිටපත් : 01. ලේකම් - උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය
02. ලේකම් - මුදල් අමාත්‍යාංශය
03. උපකුලපති - කැලණිය විශ්වවිද්‍යාලය
04. සභාපති - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

2016 දෙසැම්බර් මස 13 වෙනිදා [illegible]

ලේකම්
මුදල් කමිටුව
පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය
කැළණිය විශ්වවිද්‍යාලය

[illegible]

2016.08.25 වන දින [illegible] 44 වන මුදල් කමිටු [illegible] 2016.11.08 දින [illegible]

| | | | |
|---|---|---|---|
| [illegible] | 15,974,472.66 | 13,013,318.66 | 2,961,154.00 |
| [illegible] | 1,458,379.00 | 643,678.25 | 814,700.75 |
| [illegible] | 5,520,430.52 | 5,516,491.19 | 3,660.67 |
| | | | 3,781,515.42 |

[illegible] රු. 3,784,515.42 [illegible]

| | | |
|---|---|---|
| [illegible] රු.2,961,154.00 | (189,305.82) | [illegible] |
| | (1,395,235.00) | [illegible] |
| | 173,867.75 | [illegible] |
| | (565,346.80) | |
| | (1,809,570.87) | [illegible] (2013.5 [illegible]) |
| | 262,180.00 | [illegible] |
| [illegible] රු.814,700.75 | (77,736.00) | [illegible] |
| | (813,130.00) | [illegible] |
| | 569,563.00 | [illegible] |
| | (99,115.00) | |
| | (881,791.75) | [illegible] (2004 [illegible]) |
| | 19,000.00 | [illegible] |
| [illegible] රු.3,660.67 | (833,875.58) | [illegible] |
| | (28,886.50) | [illegible] |
| | (83,011.73) | [illegible] |
| | (38,565.00) | [illegible] (2002 [illegible]) |
| | 156,075.58 | [illegible] |

1. 2011 [illegible] රු. 485,019.73 [illegible]

2. [illegible] ලාබුයන් නොමැති වීම හේතුවෙන් එම වත්කම්වල ප්‍රත්‍යාගණනය කර ස්ථාවර වත්කම් ලේඛනය තුළ පවතින ඇති අතර පිරිවැය ලේජර් ගිණුම් තුළින් ඉවත් නොකිරීම. අදාළ පිරිවැය හඳුනාගැනීමට ප්‍රමාණවත් තොරතුරු නොමැත.

3. 2011 වර්ෂයෙන් පසු 2015 වනතෙක් අබලි ද්‍රව්‍ය ලෙස හඳුනා ගත්ත වෙන්දේසියක් මගින් ඉවත් කිරීමට ඇති භාණ්ඩ නොවටනා පිරිවැයද ලේජර් ගිණුම් වල පවතින අතර ස්ථාවර වත්කම් ලේඛනය තුළ අන්තර්ගත නොවීම. (ඉවත්කර ඇති භාණ්ඩ නොවටනා පිරිවැය වටිනාකම් හඳුනාගැනීමට ප්‍රමාණවත් තොරතුරු නොමැත.)

නිර්දේශ

1. වත්කම් ප්‍රත්‍යාගණන, හඳුනාගොනාගත් වත්කම් ඉවත් කිරීම සහ වත්කම් ඉවත් කිරීමට අදාළ පහත සටහන් ගිණුම්ගත කිරීමට කමිටුව මගින් නිර්දේශ කරමි.
   - (i) හඳුනාගොනාගත් වත්කම් පිරිවැය ඉවත්කිරීම (Removal of unidentified assets)
   - (ii) ක්ෂය වටිනාකම් ඉවත්කිරීම (Removal of depreciation)
   - (iii) ප්‍රත්‍යාගණන වටිනාකම ගිණුම්ගත කිරීම (Incorporation of revaluation to the Fixed Assets Register)
   - (iv) ප්‍රත්‍යාගණන අතිරික්තය ගැලපීම (Adjustment to revaluation Surplus / Deficit)

[redacted]

Cost
Debit Revaluation A/C
Credit Assets A/C

Depreciation
Debit Accumulated Depreciation
Credit Revaluation A/C

Revaluation Amount
Debit Assets A/C
Credit Revaluation A/C

Revaluation Surplus / Loss
Surplus
Debit Revaluation A/C
Credit Revaluation Surplus
Loss
Debit Revaluation Loss
Credit Revaluation A/C

[redacted]

Cost
Debit Disposal A/C
Credit Assets A/C

Depreciation
Debit Accumulated Depreciation
Credit Disposal A/C

Sale Amount
Debit Cash
Credit Disposal A/C

Disposal Surplus (Profit / Loss)

Profit
Debit Disposal A/C
Credit Income Statement

Loss
Debit Income Statement
Credit Disposal A/C

2. වැය ශීර්ෂ අතර වෙනස්වීම් වලට අදාල ගැලපීම සිදුකර ගිණුම් අතර පවතින නොගැලපීම් නිවැ කළයුතුය.

<u>වත්කමේ ප්‍රයෝජනවත් ජීවිත කාලය</u>

- ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත අංක 7 හි 71 ඡේදයේ දක්වන පරිදි වත්කමක ප්‍රයෝජනවත් ජ කාලය ඇස්තමේන්තු කිරීම

  වත්කම් කළමනාකරණ ප්‍රතිපත්තිය අනුව නියමිත කාලයකට හෝ වත්කමේ අන්තර්ගත අනා ආර්ථික ප්‍රතිලාභ හෝ සේවා ශක්‍යතා වලින් නියමිත ප්‍රමාණයක් පරිභෝජනය කිරීමෙන් ප වත්කම් ඉවත්කරනු ලැබිය හැක.එමනිසා වත්කමක ප්‍රයෝජනවත් ජීවිත කාලය එහි ආර්ථික ජී කාලයට වඩා කෙටිවිය හැක. වත්කමක ප්‍රයෝජනවත් ජීවිත කාලය ඇස්තමේන්තු කිරීම ආයතන හා සමාන වත්කම් සම්බන්ධයෙන් ඇති පලපුරුද්ද මත පදනම් වූ විනිශ්චයාත්මක දෙයකි. මේ අනු වත්කම් වල ප්‍රයෝජනවත් ජීවිත කාලය ප්‍රගණනයේදී නොසැලකීමටත් ක්ෂය ප්‍රතිශත. අදා ප්‍රගණනය වත්කමේ ඉදිරියේදී ක්ෂය ගණන් කිරීමටත් කළයුතුය.

අවශ්‍ය කටයුතු සඳහා පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ විගණන කමිටුව වෙ ඉදිරිපත් කරමි.

..........................................
සභාපති
ගිත් දිසානායක
ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක

| | | |
|---|---|---|
| කමිටු සාමාජික | කමිටු සාමාජික | කමිටු සාමාජික |
| රසිකා පියාන්ති | සුමිත් ජයවීර | සංජීව දිසානායක |
| විගණන සහකාර | විගණන සහකාර | විගණන සහකාර |

පිටපත් - අධ්‍යක්ෂක ස්වාමීන් වහන්සේ / පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය

2017.02.28

**2017.02.27 වැනි දින පැවැති 47 වැනි විගණන කමිටු රැස්වීමේ තීරණ**

**මණ්ඩලීය පත්‍රිකා අංක 02**

**ස්ථාවර වත්කම් ලේඛනය පිළියෙල කිරීම/ අවසන් ගිණුම් හා සංසන්දනය කිරීම**

ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය හා ගිණුම්වල සැසඳීම කළ නොහැකි දෝෂයන් සම්බන්ධයෙන් 2016 වැනි දින කරන ලද පරීක්ෂාවට අනුව කර තිබූ නිර්දේශ විගණන කමිටුවේ අවධානයට යොමු විය. වර්ෂයේ අවසන් ගිණුම් සකස් කිරීමෙන් පසුව මෙ සම්බන්ධයෙන් රජයේ විගණන අංශය මඟින් ලබා දෙද නිර්දේශය කළමනාකාර මණ්ඩලයට ඉදිරිපත් කර කළමනාකාර මණ්ඩල නිර්දේශය උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත යවා අනුමැතිය ලබා ගැනීමට විගණන කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

අවසාන ගිණුම් සකස් කිරීමේදී වැය ශීර්ෂ අතර මාරුවීම නිවැරදි කර පැහැදිලිව සටහන් කරන ලෙස දන්වා ලදී. ඊ සඳහා අවශ්‍ය පත්‍රිකා ද ඉදිරිපත් කරන ලෙස දන්වන ලදී.

HH.06

මාණ්ඩලික පත්‍රිකා අංක 05

**ස්ථාවර වත්කම් ලේඛනය හා අවසන් ගිණුම් සංසන්දනය කිරීම**

මෙම ආයතනයේ 2015.12.31 දැනි දිනට වත්කම්වලට අනුව ආයතනය තුළ සොයා ගත හැකිව තිබූ තොරතුරු අනුසාරයෙන් පිළියෙල කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය එදිනට අවසන් ගිණුම් සමග වත්කම් වර්ග අනුව සංසන්දනය කර තිබුණි. එහිදී 2015 වර්ෂයේ සිට පෙර ආසන්න වර්ෂ 07ක් සඳහා පමණක් වෙනසට හේතු අනාවරණය කර ගත හැකි වූ අතර ඉන් පෙරද පැවති ශේෂයන්හි වෙනසක් පැවැතිය ද ඊ සඳහා පැහැදිලි හේතු සොයා ගත නොහැකි විය. ඉහත ශේෂයන්හි වෙනස සඳහා සමස්ත වශයෙන් පහත කරුණු ද බලපා ඇති බව අනුමාන කළ හැකි බව දන්වා තිබුණි.

(01) ප්‍රත්‍යාගණනය කළ වත්කම්වල පිරිවැය.

(02) 2011 වර්ෂයේ සිට වසර 05ක් තුළ ගිණුම්වලින් ඉවත් නොකරන ලද අබලි භාණ්ඩවල පිරිවැය.

(03) හඳුනා නොගත් පරිත්‍යාග.

ඊ අනුව ස්ථාවර වත්කම් ලේඛනය හා අවසන් ගිණුම් අතර රුපියල් මිලියන 4.4ක පමණ වෙනසක් පෙන්නුම් කෙරේ.

මේ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සඳහා විගණන කමිටු නිර්දේශ හා උපදෙස් පිණිස ඉදිරිපත් කර තිබුණි.

ස්ථාවර වත්කම් ලේඛන සංසන්දනයෙහි 2015.12.31 දිනට සාරාංශගත තොරතුරු පහත පරිදි දක්වා තිබුණි.

| | ස්ථාවර වත්කම් ලේඛනය(රු.සත) | අවසාන ගිණුම් (රු.සත) |
|---|---|---|
| කාර්යාල හා ඉංජිනේරු උපකරණ (OE) | 11,339.930 | 15,433,051 |
| ලීවඩු හා සවි කිරීම් (FF) | 3,192,214 | 3,516,492 |
| මෝටර් වාහන (MV) | 10,250,000 | 10,250,000 |
| පුස්තකාල පොත් හා වාර සඟරා | 8,185,105 | 8,185,105 |
| | 32,967,249 | 37,384,648 |

4,417,340

මේ සම්බන්ධයෙන් කමිටුවක් පත් කර සාධාරණ හේතූන් පෙන්වා දී එම ශේෂයන්හි වෙනස සම්බන්ධයෙන් තීරණයක් ගැනීම සුදුසු බව දන්වන ලදී.

මේ සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර විගණන අංශය, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අභ්‍යන්තර විගණන අංශයේ නියෝජිතයකු පත් කර දීමට එකඟ වූ අතර අධ්‍යයනාංශ නියෝජිතයකු ද පත් කර ගැනීමට උපදෙස් දෙන ලදී.

ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී

HH.07

| | | | |
|---|---|---|---|
| **විගණන කරුණු අංක 01** | | | |
| (01) **2016 අධ්‍යයන වර්ෂය තුළ පවත්වනු ලබන ස්වයං මූල්‍ය පාඨමාලා සඳහා වන අයවැය ලේඛනය**<br><br>අනෙක ස්වයං මූල්‍ය පාඨමාලාවලින් ගෙවීම සම්බන්ධයෙන් ඇති තැවිල සම්බන්ධයෙන් ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි විසින් විමසන ලදී. | ඒ පිළිබඳව සාකච්ඡා කළ විගණන කමිටුව විශ්වවිද්‍යාලය ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 04/2016 අනුව සකස් කළ 2016 අධ්‍යයන වර්ෂය තුළ පවත්වනු ලබන ස්වයං මූල්‍ය පාඨමාලා සඳහා වන අයවැය ලේඛනය 2016.08.25 වැනි දින පැවති විගණන කමිටුවට ඉදිරිපත් කර තිබුණි. එහිදී අදාළ පාඨමාලා අවසානයේ ගෙවීම් කිරීමට උපදෙස් දී තිබුනද එය ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමට අපහසු බැවින් මෙ දක්වා ලැබී ඇති මුදල් ප්‍රමාණයට සමානුපාතික පදනමක් මත සියලු ගෙවීම(ලේවක දීමනාද ඇතුළුව) ගෙවීම කළ හැකි බව විගණන කමිටුව විසින් නිර්දේශ කරන ලදී. | ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි<br><br>ජ්‍යෙෂ්ඨ සහකාර මුල්‍යාධිකාරි | |
| | | | |

